# උපායමාර්ගික සැලැස්ම








කෘෂිකර්ම ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලප්‍රවාහන,
ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමූපකාර අමාත්‍යාංශය
උතුරු පළාත

# කෘෂිකර්ම අමාත්‍යාංශයේ පස් අවුරුදු සැලැස්මේ පටුන


| | |
|---|---|
| පටුන | 02 - 03 |
| ඇමුණුම | 04 - 05 |
| ප්‍රස්තාර ලැයිස්තු | 05 |
| වගු ලැයිස්තුව | 05 |
| කෙටි යෙදුම් | 06 |
| විධායක සාරාංශය | 06-09 |
| 1. පරිච්ඡේදය 01 - ආයතනික පසුබිම, කාර්යභාරය හා විකාශය | 10 |
| 1.1. ආයතනයේ පසුබිම | 10 |
| 1.2. බලය ලැබීම | 10 - 11 |
| 1.3. අමාත්‍යාංශයේ කාර්යභාරය | 12-13 |
| 1.4. අමාත්‍යාංශයේ විකාශනය | 14 |
| 2. පරිච්ඡේදය 02 - උපායමාර්ගික දිශානතීන් | 15 |
| 2.1. අමාත්‍යාංශයේ මෙහෙවර | 16 |
| 2.2. අමාත්‍යාංශයේ දැක්ම | 17 |
| 2.3. කාර්ය සාධක දර්ශක | 18-21 |
| 2.4. අපගේ සංවිධාන පරමාර්ථයන් | 22-24 |
| 2.5. අපගේ සංවිධාන උපායමාර්ග | 25-25 |
| 2.6. අපගේ අගයන් | 25-26 |
| 3. පරිච්ඡේදය 03 - ආයතනයේ අභ්‍යන්තර පරිසරය හා තත්ව විශ්ලේෂණය | 27-28 |
| 3.1. සංවිධාන ව්‍යුහය | 28 |
| 3.2. අලෙවිකරණ පරිසරය | 29 |
| 3.3. මූල්‍ය පරිසරය | |
| 3.3.1. සංවර්ධන කටයුතු සඳහා මූලධන ප්‍රතිපාදන | 30 |
| 3.3.2. පුනරාවර්තන ප්‍රතිපාදන | 31 |
| 3.4. තාක්ෂණික මෙහෙයුම් පරිසරය | 32 |
| 3.5. වත්කම් | 33-34 |

| | | | |
|---|---|---|---|
| 4. | පරිච්ඡේදය 04 - බාහිර පාරිසරික විශ්ලේෂණය | | 36 |
| | 4.1. | දේශපාලනික | 36 |
| | 4.2. | ආර්ථික | 36 |
| | 4.3. | සමාජයීය | 36 |
| | 4.4. | තාක්ෂණික | 37 |
| | 4.5. | පාරිසරික | 37 |
| | 4.6. | නීතිමය | 37 |
| 5. | පරිච්ඡේදය 05 - පසුගිය වර්ෂයන්හි කාර්යසාධන සමාලෝචනය | | 38 |
| | 5.1. | වර්තමාන තත්වය | 39-41 |
| | 5.2. | මෙහෙයුම් සමාලෝචනය | 42-44 |
| | | රූප සටහන් | 45-52 |
| | 5.3. | මූල්‍ය සමාලෝචනය | 53-56 |
| | 5.4. | මූල්‍ය පුරෝකථන | 57 |
| 6. | පරිච්ඡේදය 06 - ශදූඅත විශ්ලේෂණය | | 58 |
| | 6.1. | ශක්තීන් | 58 |
| | 6.2. | දුර්වලතා | 58 |
| | 6.3. | අවස්ථා | 59 |
| | 6.4. | තර්ජන | 60 |
| 7. | පරිච්ඡේදය 07 - ක්‍රියාත්මක ක්‍රමවේදය | | 61 |
| | 7.1. | සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම | 62 |
| | 7.2. | අප කළ යුත්තේ කුමක්ද? | 63 |
| | 7.3. | අභියෝගයන් | 64 |
| 8. | පරිච්ඡේදය 08 - උපාය මාර්ගික ප්‍රගති සමාලෝචන, | | 65 |
| | 8.1. | ඇගයීම හා පාලනය | |
| | 8.2. | නිගමන ක්‍රමවේදය | 66 |
| | 8.3. | මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචනය | 67-68 |

# ඇමුණුම්


9. ඇමුණුම 01
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය 70

10. ඇමුණුම 02
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය තනතුර අනුව කාර්ය මණ්ඩලය 71

11. ඇමුණුම 03
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා යෝජිත සංවිධාන ව්‍යුහය 72

12. ඇමුණුම 04
බාහිර පාරිසරික සාධක විශ්ලේෂණය (PESTEL) 73-76
ජල සම්පාදන හා ජලාපවහන අංශය
ආහාර සැපයුම් අංශය
වෙළෙඳ අංශය
කෘෂිපාදක කර්මාන්ත සංවර්ධන අංශය

13. ඇමුණුම 05
ශදුඅත විශ්ලේෂණය (SWOT) 77-81
ජල සම්පාදන හා ජලාපවහන අංශය
ආහාර සැපයුම් අංශය
වෙළෙද අංශය
කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය අංශය

14. ඇමුණුම 06
අමාත්‍යාංශයයීය ක්‍රියාකාරී සැලැස්ම 82-107

15. ඇමුණුම 07
උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට අදාළ ගැටළු විසඳුම්
හා උපායමාර්ග 108-124
වෙළෙඳ අංශය
කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය අංශය
ආහාර සැපයුම් අංශය
ජල සම්පාදන හා ජලාපවහන අංශය

16. ඇමුණුම 08
වයාපෘති කේෂ්ත්‍ර පරීක්ෂා කිරීම් වලදී තොරතුරු ලබා ගන්නා ආකෘති පත්‍රයක් 125

17. ඇමුණුම 09
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2019-08 -06 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා 126-128

18. ඇමුණුම 10
ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචන ආකෘතිය 129-130

19. ඇමුණුම 11
පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා සහභාගී වූවන්ගේ නාම ලේඛනය 131-133

# ප්‍රස්තාර ලැයිස්තු

3.3. සංවර්ධන කටයුතු සඳහා මුලධන ප්‍රතිපාදන හා පුනරාවර්තන ප්‍රතිපාදන වෙන්ව ඇති ආකාරය

# වගු ලැයිස්තු

1.4. අමාත්‍යාංශයේ විකාශනය
2.3 කාර්ය සාධක දර්ශක
2.5 අපගේ සංවිධාන උපාය මාර්ගයන්
3.2. අමාත්‍යාංශය මගින් ලබා දෙන සේවාවන්
3.3.1 මුලධන ප්‍රතිපාදන වෙන්වීම්
3.3.2 පුනරාවර්තන ප්‍රතිපාදන වෙන්වීම්
3.5. අමාත්‍යාංශය සහ ඒ යටතේ පැවති දෙපාර්තමේන්තු සතු වත්කම්
5.3. ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සමාලෝචනය
5.4. 2020-2024 මුල්‍ය පුරෝකථන

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| GMP | - | යහ නිෂ්පාදන පිළිවෙත් |
| PESTLE | - | බාහිර පාරිසරික විශ්ලේෂණය |
| EBR | - | ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාර නාම ලියාපදිංචිය |
| ADTU | - | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන හා පුහුණු ඒකකය |
| ISO | - | ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය |
| SWOT | - | ශදුඅත විශ්ලේෂණය |
| OBT | - | බාහිර සේවාස්ථ පුහුණු |
| E – Record room | - | ඉලෙක්ට්‍රොනික ලේඛනාගාරය |
| E – Stores | - | ඉලෙක්ට්‍රොනික ගබඩාව |

# විධායක සාරාංශය

දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග..... අමාත්‍යාංශය දකුණු පළාතේ කෘෂිකර්ම සංවර්ධනය, වාරිමාර්ග සංවර්ධනය, නඩත්තුව හා ගංවතුර පාලනය, සමූපකාර සංවර්ධනය යන විෂයයන් සම්බන්ධව ප්‍රධාන වගකීම දරන්නා ලෙසත් ජල සම්පාදන, ආහාර සැපයුම්, වෙළෙඳ සහ කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය යන විෂයයන් හරහා ජනතාවට පහසුකම් සලසන්නෙකු ලෙසත් මේ වනවිට කටයුතු කරමින් සිටී.

කෘෂිකාර්මික රටක් ලෙස පෙරට යන ගමනේදී කෘෂිකර්ම හා වාරිමාර්ග විෂයන් සෘජු නිෂ්පාදනය සඳහා ද සමූපකාර, ආහාර සැපයුම්, ජල සම්පාදන, වෙළෙඳ හා කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය විෂයන් අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ද යොමු කරවමින් කටයුතු කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු විය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේදී අප මුහුණ දුන් ප්‍රධානම අභියෝගය වූයේ අමාත්‍යාංශයට ලැබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය පළාතේ ඉටු කළ යුතු සංවර්ධන අවශ්‍යතා සමඟ ගලපා ගැනීමයි. 2014 වර්ෂයේ හය වන පළාත් සභා වාරය පත්වීමත් සමගම එම අභියෝගයට මුහුණ දීම සඳහා දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2015 – 2019 වර්ෂයන් සඳහා ප්‍රථම වතාවට පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීම සිදුකරන ලදී. එම සැලැස්ම අනුව 2015 සිට මේ දක්වා සංවර්ධන ව්‍යාපෘතින් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර, 2019 වර්ෂය වන විට සාර්ථක ලෙස එහි අපේක්ෂිත නිමැවුම් ළඟා කර ගන්නා ලදී.

ඉදිරි 2020- 2024 කාල සීමාව සඳහා මෙම පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම පිළියෙල කරනුයේ දෙවන වතාවටය. මෙහිදී ඉදිරි වර්ෂ 5 සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී වත්මන් රජයේ ප්‍රධානතම ප්‍රතිපත්ති ප්‍රකාශනය වන ‘‘රට හදන සෞභාග්‍යයේ දැක්ම’’ දස වැදෑරුම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිළිබඳව ප්‍රමුඛ අවධානය යොමු කරන ලදී. ‘‘රට හදන සෞභාග්‍යයේ දැක්ම’’ අනුව 2020-2025 සාර්ව ආර්ථික ඉලක්කයන් ලෙස දක්වා ඇති ආර්ථික වර්ධන වේගය 6.5%කින් ඉහළ නැංවීම, ඒක පුද්ගල ආදායම ඇ.ඩො.6500 දක්වා ඉහළ නැංවීම, සේවා වියුක්ති අනුපාතය 4% දක්වා අඩු කිරීම, රුපියලේ අගය ස්ථාවරව පවත්වා ගැනීම වැනි අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා උපායමාර්ගයන් සැලසුම් කරන ලදී.

මෙම උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ මූලික පියවරක් වශයෙන් එක් එක් විෂයයන්ට අදාළ පාර්ශවකරුවන් කැඳවා විෂයයට අදාළ ගැටළු, විසඳුම් හා උපායමාර්ග හඳුනා ගැනීමට කටයුතු කළෙමු. එසේ හඳුනා ගන්නා ලද ගැටළු සඳහා අවශ්‍ය වන විසඳුම් හා උපායමාර්ගික වඩාත් පුළුල්ව විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා එක්ව සාකච්ඡා කර එක් එක් දෙපාර්තමේන්තුව හා අංශය සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කළෙමු. මෙහිදී එම විෂයන්ට අදාළ පාරිසරික විශ්ලේෂණයන්

මෙන්ම තත්ත්ව විශ්ලේෂණයන්ද සිදුකොට වඩාත් පුළුල්ව අදාළ වපසරිය හඳුනා ගන්නා ලදී.

මෙතෙක් ක්‍රියාත්මක වෙමින් පැවති සාමාන්‍ය පරිපාලන රටාවෙන් මිදී ජනතා අවශ්‍යතා, දැනුම, ආකල්ප, රුචි අරුචිකම් හඳුනාගනිමින් දේශගුණික හා පාරිසරික සාධක මෙන්ම භූමිය, ශ්‍රමය භෞතික හා මානව සම්පත් කළමණාකරණය කරමින් පළාත තුළ විෂය සමගාමී සංවර්ධනයක් සඳහා ක්‍රමෝපායන් කිසියම් නිශ්චිත කාල පරාසයක් තුළ නියමිත ඉලක්කයන් කරා මෙහෙයවීමට මෙම උපායමාර්ගික සැලැස්ම මහෝපකාරී වනු ඇත.

එසේම දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයීය 2020-2024 පස් අවුරුදු උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පළමුවන පරිච්ඡේදය යටතේ ආයතනයේ පසුබිම, අප අමාත්‍යාංශයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා බලය ලැබුනු ආකාරය හා අමාත්‍යාංශයේ විෂය පථය හරහා සිදුකරන ලබන කාර්යභාරය මෙන්ම අමාත්‍යාංශයේ විකාශනය සවිස්තරාත්මකව දක්වා ඇත. එමෙන්ම අපගේ අමත්‍යාංශයේ මෙහෙවර, දැක්ම, කාර්ය සාධක දර්ශක මෙන්ම අපගේ ආයතනික පරමාර්ථයන් හා ඒවා ක්‍රියාත්මක කිරිමට උපයෝගී කර ගන්නා උපායමාර්ගයන් පිළිබඳව කරුණු, 02 වන පරිච්ඡේදයෙන් විස්තර කර ඇත.

මෙහි 3 වන පරිච්ඡේදය මගින් දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය පිළිබඳ විස්තර දක්වා ඇත. එමෙන්ම අමාත්‍යාංශය මගින් ඉටු කරන සේවාවන් පිළිබඳව විස්තරද මේ යටතේ දක්වා ඇත. සංවර්ධන කටයුතු සඳහා වෙන්වූ මුලධන ප්‍රතිපාදන, පුනරාවර්තන ප්‍රතිපාදන හා අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවලට අයත් වත්කම් පිළිබඳවද පරිච්ඡේදය 3 යටතේ විස්තර කර දක්වා ඇත. ආයතනය සඳහා බලපානු ලබන බාහිර පාරිසරික තත්වයන් පිළිබඳව විශ්ලේෂණය කිරීම සඳහා බාහිර පාරිසරික විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ආකාරය පරිච්ඡේදය 4 මගින් සවිස්තරාත්මකව දක්වා ඇත.

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හඳුනාගත් ඉලක්ක වෙත ළඟා වීමට ඒ ඒ අංශ මගින් ඉටු කරන ලද කාර්යයන් සහ එහි වර්තමාන තත්වය හා 2014 – 2019 දක්වා පසුගිය වර්ෂ 5ක කාල සීමාව තුළ දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පසු කරන ලද සුවිශේෂි සංදිස්ථාන කිහිපයක් විස්තරාත්මකව රූප රාමු හරහා දක්වා ඇත. එසේම ප්‍රාග්ධන හා පුනරාවර්තන යන අංශයන්හි පසුගිය වසර තුනක වියදම් කරන ලද ආකාරය හා ඉදිරි පස් වසර සඳහා වැය කිරීමට අපේක්ෂිත සමස්ථ ඇස්තමේන්තු අවශ්‍යතාවය පරිච්ඡේදය 5 මගින් විස්තර කර දක්වා ඇත. පොදුවේ අමාත්‍යාංශය සඳහා මෙන්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශයන් සඳහා ද, වෙන වෙනම ශඳුඅත විශ්ලේෂනයන් සිදුකර අංශය සතු ශක්තීන්, දුර්වලතා මෙන්ම මුහුණදීමට සිදුවන තර්ජන හා භාවිතා කළ හැකි අවස්ථාවන් කවරේද යන්න හඳුනා ගැනීම පරිච්ඡේදය 6 මගින් හඳුනා ගැනීම සිදුකරන ලදී.

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම, අප විසින් කළ යුත්තේ කුමක්ද? හා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී එල්ලවිය හැකි ගැටළු හා අභියෝගයන් පිළිබඳව පරිච්ඡේදය 7 මගින් විස්තර කර දක්වා ඇති අතර, 2020-2024 පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මෙහි ප්‍රගතිය නියාමනය හා ඇගයීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව නිශ්චිත උපායමාර්ගික සැලසුම් ප්‍රගති සමාලෝචන හා ඇගයීම් ක්‍රමවේදයක් පැවතීම මගින් ආයතනයේ පරමාර්ථ හා අරමුණු කරා මගින් ළගාවීම ඇති හැකියාව පරිච්ඡේදය 8 මගින් සවිස්තරාත්මකව දක්වා ඇත.

අමාත්‍යාංශයේ ඉහළ සිට පහලට කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉදිරි වසර කීපය තුළ කටයුතු හා සපුරාගත යුතු වැඩ කොටස් හා ඉලක්කයන් පිළිබඳව අවබෝධයක් ලබා දීම තුලින් මෙම උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම යථාර්ථයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

අදාළ සේවාලාභීන් වෙත ප්‍රශස්ථ සේවාවක් ලබාදීම සඳහා විධිමත් උපාය මාර්ගික සැලසුමක අනිවාර්ය අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අමාත්‍යාංශය 2020-2024 කාල පරාසය සඳහා සකස් කරන ලද උපාය මාර්ගික සැලසුම සඳහා වන ප්‍රවිශිෂ්ඨය මේ තුලින් ලබා ගෙන ඇත. අදාළ පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා මුල්කරගෙන සිදුකරන ලද විද්‍යාත්මක අධ්‍යයනයක් තුලින් ඉදිරි පස් වසර සඳහා සැලසුම සකස් කිරීම සහ එහි සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය පසු විපරම් ක්‍රමවේදය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම තුලින්, තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම අමාත්‍යාංශයේ අභිප්‍රාය වී ඇත.



# පරිච්ඡේදය - 01
# ආයතනික පසුබිම, කාර්යභාරය හා විකාශය
# CORPORATE BACKGROUND, GOVERNANCE, POWERS, FUNCTIONS & EVOLUTION

## 1.1 ආයතනයේ පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අංක 154 දරණ ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාව තුළ බලය විමධ්‍යගත කිරීමේ අරමුණින් පළාත් සභා ස්ථාපිත කරන ලදී. ඒ අනුව 1987 වර්ෂයේදී අංක 42 දරණ පළාත් සභා පනත යටතේ 1988 ජූනි 02 වෙනි දින පැවැත්වූ පළාත් සභා මැතිවරණයෙන් අනතුරුව 1988 ජූනි 13 වන දින දකුණු පළාත් සභාව ස්ථාපිත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII(අ) වැනි පරිච්ඡේදයට අනුව 154(ආ) වගන්තිය යටතේ දකුණු පළාත් සභාව සඳහා ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාරි පත්‍රයක් මගින් ආණ්ඩුකාරවරයා පත් කරන ලදී. පළාත් සභාව සඳහා පස් දෙනෙකුගෙන් සැදුමලත් අමාත්‍ය මණ්ඩලයක් පත් කරනු ලබන අතර, ප්‍රධාන අමාත්‍යාවරයා ඇමති මණ්ඩලයේ ප්‍රධානත්වය උසුලයි. වර්ෂ 1988-06-16 දින දී දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන....... අමාත්‍යාංශය ද මුල් වරට දකුණු පළාත තුළ ස්ථාපිත වූ අතර මේ වන විට මෙම අමාත්‍යාංශය දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය ලෙස ගාල්ල, ලබුදූව, දක්ෂිණපාය ගොඩනැගිල්ලේ සිව්වන මහලේ ස්ථාපිත කර ඇත.

ආයතන ප්‍රධානියා ලෙස අමාත්‍යංශ ලේකම් කටයුතු කරන අතර සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ගණකාධිකාරිවරයෙකු ඇතුළු පනස් හතර දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙහි සේවය කරති. අමාත්‍යංශය ආයතන, සංවර්ධන හා ගිණුම් වශයෙන් ප්‍රධාන අංශ තුනකට බෙදා ඇත. කෘෂිකර්ම විෂය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවද, වාරිමාර්ග විෂය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවද, සමුපකාර සංවර්ධන විෂය යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවද පවතින අතර ජල සම්පාදන, ආහාර සැපයුම් හා බෙදා හැරීම, වෙළෙඳ හා කෘෂිපාදක සංවර්ධන යන විෂයයන් වලට අදාළව වැඩසටහන් අමාත්‍යංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. අමාත්‍යංශය යටතේ පවතින විෂයයන් අතර මනා සම්බන්ධීකරණයක් තුළින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම අමාත්‍යංශය මඟින් සකස් කරන අතර මේ තුළින් පළාතේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වනු ඇත.

## 1.1 බලය ලැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග, එහි 9 වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ හෙවත් පළාත් සභා ලැයිස්තුව යටතේ පවතින විෂයයන් ලෙස කෘෂිකර්ම, වාරිමාර්ග හා සමුපකාර සංවර්ධන යන විෂයයන්ට අදාළව ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ 154(උ) වගන්තිය යටතේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, දකුණු පළාත් සභා බල ප්‍රදේශයට අදාළව ප්‍රඥප්ති සකස් කිරීම සිදු කළ හැක. උක්ත බලතල පැවරීම අනුව දකුණු පළාතට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම, පළාත්බද කාර්යයන් සඳහා කෘෂිකර්ම ව්‍යාපෘති ප්‍රවර්ධනය, කෘෂිකාර්මික සේවා හා සුළු වාරිමාර්ග වැඩකටයුතු පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම, කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු, පළාත ඇතුළත ආහාර සැපයීම හා බෙදා හැරීම, වෙළෙඳපොළවල් සම්බන්ධ

කටයුතු, සමූපකාර ව්‍යාපාර සහ පළාත තුළ සමූපකාර සමිති සංවිධානය, ලියාපදිංචිය, අධීක්ෂණය හා විගණනය, පළාත්බද සමූපකාර සේවා නියුක්තිකයන්ගේ කොමිෂන් සභාව, පළාත තුළ සමූපකාර සේවා නියුක්තිකයන්ගේ උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ සේවා නියුක්තිකයන් හා සම්බන්ධ අනෙකුත් කාරණා සම්බන්ධවද බලතල මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

එමෙන්ම අන්තර් පළාත් වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රම හැර සියළු වාර්මාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා නඩත්තුවද සම්බන්ධයෙන් නවවන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුව ප්‍රකාරව බලය පැවරී ඇත.

එමෙන්ම සංවර්ධන සහ ක්‍රම සම්පාදන හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තීන් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමට යටත් වූ කෘෂිකාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය හා එවැනි වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති හා ව්‍යාවසායකයන් කරගෙන යාම මෙන්ම කාර්මික හා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහාද බලතල පැවරී ඇත. මීට අමතරව සමගාමී ලැයිස්තුගත විෂයයන් ලෙස ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදා හැරීම්, වෙළෙඳ හා කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය යන අංශයන්ද මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ.

## 1.2 අමාත්‍යාංශයේ කාර්ය භාරය

අමාත්‍යාංශයේ සාමාන්‍ය කළමනාකරණ කටයුතු පවත්වා ගෙන යාම සඳහා ආයතන, සංවර්ධන හා ගිණුම් වශයෙන් ප්‍රධාන අංශ 3 කින් සමන්විත වේ. මීට අමතරව සංවර්ධන විෂයයන් මෙහෙයවීම සඳහා වෙළෙඳ, ආහාර සැපයුම් හා බෙදා හැරීම්, ජල සම්පාදන හා ජලාපවහන සහ කාෂිපාදක කර්මාන්ත සංවර්ධනය වශයෙන් තවත් අංශ හතරකට බෙදා ඇත.

ඉහත එක් එක් අංශයේ කාර්ය භාර්ය පහත පරිදි වේ.

### 01. ආයතන අංශය

- පත්වීම් බලධාරීයා ලෙස තිබෙන තනතුර සඳහා බඳවා ගැනීම්, උසස් වීම් ,විනය පාලනය හා කාර්ය සාධනයට අදාළ කටයුතු
- නිලධාරීන් පුහුණු කිරීම්
- විශ්‍රාම ගැන්වීම්
- කාර්යාලයේ තැපැල මෙහෙයවීම
- අමාත්‍යාංශය සතු වාහන නඩත්තුව හා අදාළ කටයුතු
- අධිකරණ කටයුතු
- ලේඛනාගාරය නඩත්තු කිරීම

### 02. සංවර්ධන අංශය

- කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියළු විෂයයන්ට අදාළව ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා පසුවිපරම් කිරීම.

- අමාත්‍යාංශය යටතේ පවතින විෂයයන් සඳහා උපාය මාර්ගික සංවර්ධන සැලසුම්කරණය.
- දෙපාර්තමේන්තු විසින් සකස් කළ සංවර්ධන සැලසුම් අදාළ ආයතන සමඟ සම්බන්ධ කිරීම.
- අමාත්‍යාංශයේ අංශවල හා දෙපාර්තමේන්තුවල සංවර්ධන ව්‍යාපෘති පරීක්ෂා කිරීම, ඇගයීම හා පසු විපරම් කිරීම.
- දත්ත හා තොරතුරු පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- ව්‍යාපෘති කටයුතුවල ප්‍රගති සමාලෝචනය හා ප්‍රගතිය වාර්තා කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය
- බාහිර පාර්ශවයන්ට දත්ත හා තොරතුරු සැපයීම.

### 03. ගිණුම් අංශය

- මූල්‍ය ඇස්තමේන්තු සැකසීම, වියදම් වාර්තා කිරීම හා අධීක්ෂණය
- ප්‍රසම්පාදන කටයුතු
- වත්කම් පාලනය
- විගණනය සඳහා තොරතුරු සැපයීම
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාසන සීමාවන් ඉක්මවන අවස්ථාවන්හිදී ඊට අදාළ කාර්යයන් සිදු කිරීම.

## සංවර්ධන විෂයයන් මෙහෙයවීම සඳහා පවතින අංශවල කාර්ය භාර්ය පහත පරිදි වේ

### 01. ජල සම්පාදන හා ජලාපවහන

- ජල සම්පාදන විෂයට අදාළව සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම හා පසු විපරම් කිරීම
- ජල මූලාශ්‍ර හා අනෙකුත් ජල තොරතුරු පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම හා යාවත්කාලීන කිරීම

### 02. කෘෂිපාදක කර්මාන්ත

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව කෘෂිපාදක කර්මාන්ත විෂයට අදාළව සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම හා පසු විපරම් කිරීම
- දකුණු පළාතේ කෘෂිපාදක කර්මාන්ත කරුවන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම

### 03. ආහාර සැපයුම්

- ආහාර සැපයුම් විෂයට අදාළව සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම හා පසු විපරම් කිරීම
- දකුණු පළාතේ ආහාර සැපයුම් තොරතරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
- රුහුණු රස සරණිය වාර්ෂික ආහාර ප්‍රදර්ශනය සංවිධානය කර පැවැත්වීම

**04. වෙළෙඳ**

- වෙළෙඳ විෂයට අදාළව සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම හා පසු විපරම් කිරීම
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම
- ව්‍යාපාර නාම ලියාපදිංචි කටයුතු සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම හා පහසුකම් සැපයීම
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ අවකාශමය දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගෙන යාම (EBR – Electronic Business Registration)

## 1.3 අමාත්‍යාංශයේ විකාශනය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනපදයේ 13 වන ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා සංශෝධනය යටතේ 1988 ජුනි 13 වන දින අභිනවයෙන් පිහිටවනු ලැබූ දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ පහ අතුරින් එක් අමාත්‍යාංශයක් ලෙස දකුණු පලාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මුල් වරට ස්ථාපිත විය. එදා සිට වර්තමානය දක්වා එක් එක් පළාත් සභා වාරයන්හිදී කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වූ විෂයය සංයුතිය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

| පළාත් සභා වාරය | කාල සීමාව | විෂයය සංයුතිය |
|---|---|---|
| **1.** 01 වන වාරය | 1988-06-16 සිට 1993-03-16 | කෘෂිකර්ම, වාරිමාර්ග, සමූපකාර සංවර්ධන, සංස්කෘතික කටයුතු ක්‍රීඩා |
| **2.** 02 වන වාරය | 1993-05-31 සිට 1999-01-28 | අධ්‍යාපන, සංස්කෘතික හා ප්‍රවෘත්ති, පරිවාස හා ළමා රක්ෂණ සේවා, ක්‍රීඩා, කෘෂිකර්ම, වාරිමාර්ග |
| **3.** 03 වන වාරය | 1999-07-08 සිට 2004-05-05 | කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, පශු සම්පත් සංවර්ධන, කම්කරු හා වෙළෙඳ |
| **4.** 04 වන වාරය | 2004-07-10 සිට 2009-07-03 | ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන |
| **5.** 05 වන වාරය | 2009-10-10 සිට 2014-01-12 | කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන හා පරිසර කටයුතු |
| **6.** 06 වන වාරය | 2014- 04-17 සිට 2019-04-09 | කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපුයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමූපකාර සංවර්ධන |



# පරිච්ඡේදය - 02
# උපායමාර්ගික දිශානතීන්
# STRATEGIC DIRECTION

## 2.1 අමාත්‍යාංශයේ මෙහෙවර (Our Mission)

"පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක්, මනා කළමනාකරණයක් සහිත වාරි පද්ධතියක්, සංවර්ධිත සමූපකාර ව්‍යාපාරයක් සමඟ නිසි ජල සම්පාදන ක්‍රමවේද, ප්‍රමිතිගත ආහාර සැපයුම් ක්‍රියාවලියක් හා යහ වෙළෙඳාමක් ඇති කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුව යමින් ප්‍රතිපත්ති සම්පාදනය, අවශ්‍ය පහසුකම් සැපයීම නියාමනය කිරීම මගින් දකුණු පළාතේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම."

අමාත්‍යාංශය යටතේ කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදා හැරීම් සහ වෙළෙඳ වශයෙන් එකිනෙකට වෙනස් අංශ හතරක් ක්‍රියාත්මක වන අතර, එම අංශයන් සඳහා මෙහෙවර වෙන වෙනම සම්පාදනය කරන ලද අතර, එම තොරතුරු පහත දක්වා ඇත.

### 2.1.1 කෘෂි පාදක සංවර්ධන අංශයේ මෙහෙවර

දකුණු පළාතේ කෘෂි ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණය ලබා දෙමින් නව වෙළෙඳපොළ ප්‍රවණතා හඳුනාගනිමින් ආනයන ආදේශක හඳුන්වාදෙමින් හා අපනයන ප්‍රවර්ධනය මගින් දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනීම දිරිමත් කරමින්, නිෂ්පාදනය ඉහළ නංවමින්, අතිරික්ත නිෂ්පාදනයට අගය එකතු කරමින් ආර්ථික ක්‍රියාවලියට සක්‍රීය දායකත්වය ලබා දීම සඳහා කෘෂිපාදක ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.

### 2.1.2 ජල සම්පාදන හා ජලාපවහන අංශයේ මෙහෙවර

නව ව්‍යාපෘති මගින් හා පවතින ජල සම්පාදන ක්‍රම ව්‍යාප්ත කිරීම මගින් ජල හිඟයෙන් පීඩා විඳින දකුණු පළාතේ ග්‍රාමීය හා නාගරික ජනතාවට ආරක්ෂාකාරී පානීය ජලය සැපයීම.

### 2.1.3 ආහාර සැපයුම් අංශයේ මෙහෙවර

තාක්ෂණික දැනුම, පුහුණුව හා යටිතල පහසුකම් සැපයීම මගින් දකුණු පලාතේ සියළු ජනතාවට නිසි ප්‍රමිතීන්ට අනුකූලව කාර්යක්ෂමව හා විධිමත්ව ආහාර සැපයුම් හා බෙදාහැරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.

### 2.1.4 වෙළෙඳ අංශයේ මෙහෙවර

දකුණු පළාතේ වෙළෙඳ ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට නව තාක්ෂණය යොදාගනිමින් නීතිමය රාමුවක් සහිත ව්‍යාපාර පරිසරයක් විධිමත්ව පවත්වාගෙන යාම තුළ නිපදවෙන භාණ්ඩ හා සේවා සඳහා ඉහළ ගුණාත්මකභාවයක් ලබා දීම හා එම ස්ථාන පහසුවෙන් හඳුනාගත හැකි ක්‍රමවේද ඇති කරලීම.

## 2.2 අමාත්‍යාංශයේ දැක්ම (Our Vision)




අමාත්‍යාංශය යටතේ කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදා හැරීම් සහ වෙළෙඳ වශයෙන් එකිනෙකට වෙනස් අංශ හතරක් ක්‍රියාත්මක වන අතර, එම අංශයන් සඳහා දැක්ම වෙන වෙනම සම්පාදනය කරන ලද අතර, එම තොරතුරු පහත දක්වා ඇත.

### 2.2.1 කෘෂි පාදක අංශය

වසර 2025 දී දකුණු පළාතේ දළ දේශිය නිෂ්පාදිතයට වැඩිම දායකත්වය ලබා දෙන අංශය කෘෂිපාදක කර්මාන්ත අංශය බවට පත් කිරීම

### 2.2.1 ජල සම්පාදන හා ජලපවහන අංශය

2030 දී දකුණු පළාතේ සැමට සුරක්ෂිත පානීය ජල සැපයුම් සේවා සැපයීම.

### 2.2.3 ආහාර සැපයුම් අංශය

වසර 2030 දී ජාතික ප්‍රමිතීන්ට අනුව ආහාර සැපයුම් හා බෙදාහැරීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීමේ දකුණු පළාතේ ප්‍රමුඛයා වීම.

### 2.2.4 වෙළෙඳ අංශය

2024 දී දකුණු පළාතේ යහ වෙළෙඳාම නියාමනයේ ප්‍රමුඛයා වීම.

## 2.3 කාර්ය සාධක දර්ශකය (Key Performance Indicators) - KPI

| අනු අංකය | කාර්ය සාධක දර්ශකය | මෙහෙයුම් ඉලක්කයන් | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| 01 | කෘෂිකාර්මික අංශයට දකුණු පළාත තුළින් ලබා දෙන දායකත්වය | 7.0 % | 7.1% | 7.3% | 7.5% | 7.6% |
| 02 | දකුණු පළාතේ කෘෂිකර්මාන්තයේ නියැලෙන ජනගහනයේ ප්‍රතිශතය | 30.7 | 30.5 | 30.3 | 30.0 | 28.0 |
| 03 | දකුණු පළාතේ තෝරාගත් බෝගවල සාමාන්‍ය අස්වැන්න ඉහළ යාම. (මෙ.ටො./ හෙක්.) වී වගාව | 4.11 | 4.22 | 4.43 | 4.55 | 4.67 |
| | අතිරේක ආහාර බෝග | 1.2 | 1.25 | 1.3 | 1.35 | 1.40 |
| | එළවළු | 13.5 | 13.75 | 14 | 14.25 | 14.50 |
| | පළතුරු | 8.4 | 8.5 | 8.6 | 8.7 | 8.8 |
| 04 | ආහාර භෝගවල පසු අස්වනු හානියේ ප්‍රතිශතය | 38% | 36% | 34% | 33% | 32% |
| 05 | වාරි සම්පාදිත ඉඩම්වල වැඩිවුන අස්වැන්න (මෙ.ටො) | 72,400 | 72,800 | 73,200 | 73,600 | 74,000 |
| 06 | ජනගහනය අනුව සමූපකාර සාමාජිකයන්ගේ ප්‍රතිශතය | 5% | 6% | 8% | 9% | 10% |
| 07 | සුරක්ෂිත පානීය ජලය සහිත ජනගහනයේ ඉහළ නංවන ලද ප්‍රතිශතය | 1% | 2% | 3% | 4% | 5% |
| 08 | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ආදායම (රු.මි) | 10.5 | 10.6 | 10.7 | 10.8 | 11.0 |
| 09 | අමාත්‍යාංශයේ විෂයයන් සඳහා වෙන් වන ප්‍රතිපාදන භාවිතා කරන ලද ප්‍රතිශතය | 100% | 100% | 100% | 100% | 100% |
| 10 | අමාත්‍යාංශය වෙත ලැබෙන විගණන ඡේද ප්‍රමාණය ප්‍රතිශතාත්මකව අඩු කිරීම. | 5% | 7% | 10% | 12% | 15% |

| KRA (Key Result Areas) | Goals |
|---|---|
| 01. සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය | 1.1 තොරතුරු තාක්ෂණය භාවිතයෙන් වැඩි දියුණු වූ සේවාවන් |
| | 1.2 යාවත්කාලීන වූ වෙබ් අඩවිය |
| 02. මෙහෙයුම් හා ඇගයීම් සඳහා නව ප්‍රවේශයක් ඇති කිරීම | 2.1 නිසි කලට මෙහෙයුම් කළ හැකි වැඩි දියුණු කළ මෙහෙයුම් පද්ධතිය |
| | 2.2 ව්‍යාපෘතීන් ප්‍රමාණාත්මකව ඇගයීමට ලක් කළ හැකි, විශ්ලේෂණාත්මක ඇගයීම් මෙවලමක් පැවතීම (Quantitatively evaluation Tool) |
| 03. මානව සම්පත් සංවර්ධනය | 3.1 වාර්ෂිකව යාවත්කාලීන කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම |
| | 3.2 නිශ්චිත කාර්ය සාධක දර්ශක ඉලක්ක පදනම් වූ කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදය |

| විෂයය | KRA | Goals |
|---|---|---|
| **ආහාර සැපයුම් හා බෙදා හැරීම** | ප්‍රමිතිගත ආහාර සැපයුමක් සහතිකකිරීම | 1.වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය |
| | | 2.ගුණාත්මක හා ප්‍රමිතිගත ආහාර පිළිබඳ දැනුවත් සමාජයක් |
| | ආහාර නිෂ්පාදනය හා වෙළෙඳපොළ ප්‍රවර්ධනය | 1. විවිධාංගීකරණය වූ ආහාර නිමවුම් |
| | | 2.ඉහළ වෙළෙඳපොල ආකර්ශනයක් |
| | තාක්ෂණික පරිවර්තන | 1.නව තාක්ෂණය යොදාගත් ආහාර නිෂ්පාදනය |
| | | 2.සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයක් |
| | ආහාර අපතේයාම අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය | 1.සුරක්ෂිත දේශීය ආහාර සංස්කෘතියක් |
| | | 2. නිවැරදි පසු අස්වනු තාක්ෂණයක් |
| **ජල සම්පාදන හා ජලාපවහන** | සුරක්ෂිත පානීය ජලය සම්පාදනය, ජල ව්‍යාපෘති කළමණාකරණය, නියාමනය, හා දැනුවත් කිරීම | 1.2024 වන විට ස්ථාපනය කරන ලද සුරක්ෂිත ග්‍රාමීය ජල යෝජනා ක්‍රම |
| | | 2.වසර පුරා තහවුරු කරන ලද සුරක්ෂිත,මිල දරා ගත හැකි හා සමානාත්මතාවයෙන් යුතු පානීය ජලය ලබා ගැනීමේ ප්‍රවේශ අවස්ථා |
| | | 3.නිසි ක්‍රමවේදයක් සහිතව ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති |

| | | |
|---|---|---|
| | | 4.කළමණාකරණය කරන ලද ජල ආතති රහිත ජනතාවක් |
| | | 5.ප්‍රජා ජල ව්‍යාපෘති වල ජලයේ ගුණාත්මක බව පිළිබඳ දත්ත පද්ධතියක් |
| | ජල දූෂණය අවම කිරීම | 1.ජල මාර්ග/ පද්ධතීන් ආශ්‍රිත අවම කරන ලද අහිතකර මානව ක්‍රියාකාරකම් |
| | | 2.පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රියාවලීන්ගෙන් යුත් කර්මාන්ත හිමියන් /ආයතන |
| | | 3.පාලනය කරන ලද ජල මතුපිට ජලජ ශාක ස්ථර රහිත ජලාශ |
| | ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම | 1.වර්ෂය පුරා ඒකාකාරීව ජල සැපයුම ලබාදෙන දිය දහරා |
| | | 2.ජල පෝෂක ප්‍රදේශ පිළිබඳ දැනුම්වත් ප්‍රජාවක් |
| **කෘෂිපාදක සංවර්ධන ප්‍රදාන** | අගයදාම සංවර්ධනය | 1. හඳුන්වාදුන් අගය එකතු කළ නව නිෂ්පාදන<br>2. අගය එකතු කිරීමේ ක්‍රමවේද<br>3. අගය එකතු කිරීමට තාක්ෂණික පරිවර්තන |
| | ව්‍යවසායකයින්ගේ මානව සම්පත් සංවර්ධනය | 1.කෘෂිපාදක කර්මාන්ත සඳහා ආකර්ෂණය කළ තරුණ ප්‍රජාව<br>2. සංවර්ධිත ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කෘෂිපාදක ව්‍යවසායකයින්<br>3. උසස් පුහුණුව ලද ව්‍යවසායකයින් |
| | තාක්ෂණික පරිවර්තන | 1. උචිත තාක්ෂණය පිළිබදව දැනුවත් ව්‍යවසායකයින්<br>2. තාක්ෂණික පුහුණු අංශ වැඩිදියුණු වූ රජයේ ගොවිපල<br>3. තාක්ෂණික දැනුම හා කුසලතාවයන්ගෙන් පිරිපුන් ව්‍යවසායකයින්<br>4. නිෂ්පාදන ධාරිතාවය හා ගුණාත්මයෙන් ඉහළ කෘෂි නිෂ්පාදන |
| | දේශිය හා විදේශිය වෙළෙඳපොළ පහසුකම් සම්බන්ධිකරණය | 1. මනා ලෙස සම්බන්ධීකරණය වු දේශිය වෙළෙඳපොළක්<br>2. මනා ලෙස සම්බන්ධීකරණය වු විදේශිය වෙළෙඳපොළක් |
| **වෙළෙඳ** | ව්‍යවසායකයින් වෙත සපයන සේවා කඩිනමින් | 1. මනා දැනුමැති/ අභිප්‍රේරණය වූ ව්‍යාවසායක ප්‍රජාවක් |

| | | |
|---|---|---|
| | සැපයීම. | 2. සෞඛ්‍යමත් පාරිභෝගික ප්‍රජාවක් |
| | පාරිභෝගික රැකවරණය/ ආරක්ෂාව තහවුරු කිරීම. | 1.සුරක්ෂිත ආහාර පහසුවෙන් ලබාගත හැකි ස්ථාන |
| | නවීන තාක්ෂණය භාවිතය. | 1.ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ශක්තිමත් කරන ලද වෙළෙඳ අංශ |

## 2.4 අපගේ සංවිධාන පරමාර්ථයන් (Co-operate Goals)

1. සුහුරු කාර්යාලයක් ( Smart Office )
2. තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුගත වීම ( Adapting for SDGs )

## 2.5 අපගේ සංවිධාන උපායමාර්ගයන් (Corporate strategies)

| සංවිධාන පරමාර්ථ | අපගේ සංවිධාන උපායමාර්ගයන් | ළඟා කර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්කයන් |
|---|---|---|
| 1.සුහුරු කාර්යාලයක් (Smart Office) | 1. තොරතුරු තාක්ෂණය භාවිතයන් වැඩි කිරීම තුළින් සේවා සඳහා ගත වන කාලය අවම කිරීම | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| | 2.රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය තුළින් අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය වී ව්‍යාපෘති සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම | 17 PARTNERSHIPS FOR THE GOALS |
| | 3. කාර්යාලීය නිලධාරීන්ගේ රැකියා තෘප්තිය වැඩි වන ආකාරයේ වැඩසටහන් හා ඇගයීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම | 8 DECENT WORK AND ECONOMIC GROWTH |
| | 4. සියලු මට්ටම්වලදී එලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන්යුතු සේවාවන් ලබා දීම | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| | 5. සියළුදෙනා අන්තර්ගත වු සහභාගිත්වයෙන් යුතු තීරණ ගැනිමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| | 6.මහජනතාවට යාවත්කාලීන වූ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| | 7. මහජනතාවට අන්තර්ජාලය සේවාවන් ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE |

| | | |
|---|---|---|
| 2.තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුව අනුවර්තන වීම - ( Adapting SDGs) | 1. ව්‍යවසායකත්වයට සහාය දක්වන සංවර්ධනාත්මක ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම 1589 |  |
| | 2. පලාතේ කෘෂි නිෂ්පාදන සඳහා විවිධාංගිකරණය, තාක්ෂණය ඉහළ නැංවීම හා නවෝත්පාදනය තුළින් වැඩි ඉල්ලුමක් ඇති කරවීම |  |
| | 3. දකුණු පළාතේ ප්‍රතිපත්ති, ක්‍රමෝපායේ හා සැලසුම් සඳහා දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම |  |
| | 4. ප්‍රතිලාභීන් වෙත ලබා දෙන සේවාවන් කළමනාකරණයේදී ප්‍රාදේශිය ප්‍රජාවගේ සහභාගිත්වය දිරිගැන්වීම |  |
| | 5. කෘෂිකාර්මික, වාරිමාර්ග, ආහාර නිෂ්පාදන වැනි ක්ෂේත්‍රයන්හිදි පිරිසිදු හා පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණය භාවිතය |  |
| | 5. නිෂ්පාදන ක්‍රියාවලිය පරිසර හිතකාමී හා වස විසෙන් තොරව සිදු කිරීම |  |
| | 6. ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන ජනගහනයේ අනුපාතය අවම කිරීම |  |

| | | |
|---|---|---|
| | 7. දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලි සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීම. |  |
| | 8. දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම |  |
| | 9. දකුණු පළාතේ සියළු දෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකිවීම |  |
| | 10. ජල දූෂනය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම. |  |

## 3.6 අපගේ අගයයන් (Our guiding principles)

**i. නායකත්වය -**

ආයතනයේ සියළුම අංශයන් මනා ලෙස කළමනාකරණය කරමින් අවස්ථානුකූලව උපායමාර්ගික තීරණයක් ගැනීම හා ආයතනයේ සමස්ත අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ශක්තිමත් නායකත්වයක් පැවතීම අපගේ අගයන් අතර ප්‍රධාන තැනක් ගනී. ආයතනයේ කාර්යමණ්ඩලයේ සියළු දෙනා ද අවශ්‍ය අවස්ථාවන්හිදී නායකත්වය උසුලමින් තම වගකීම ඉටු කිරීම විශේෂ ලක්ෂණයකි.

**ii. සාමූහිකත්වය -**

ආයතනයේ කාර්ය මණ්ඩලයේ සියළුදෙනා හට වෙන් වෙන් වශයෙන් රාජකාරී පවරා ඇත. එහෙත් එක් පුද්ගලයෙකුට තනිව ඉටු කළ නොහැකි සුවිශේෂී ප්‍රදර්ශන, උත්සව වැනි අනෙකුත් අවශ්‍ය වන ඕනෑම අවස්ථාවන්හිදී ආයතන කාර්ය මණ්ඩලයේ සියළු දෙනා සාමූහිකව වගකීමට බැඳෙමින් අදාළ කාර්යයන් ඉටු කිරීම.

**iii. සමානාත්මතාවය -**

ආයතනයේ නායකත්වය,දෙවන පෙළ කළමණාකාරිත්වය සහ අනෙකුත් නිලධාරින් විවිධ තරාතිරමට අයත් සේවා ගණන නියෝජනය කලද ඔවුන් සියළු දෙනා සමානාත්මතාවයෙන් සැලකීම ආයතනයේ පවතින අගයකි. එමෙන්ම ආයතනය විසින් බාහිර සහ අභ්‍යන්තර සේවා සැපයීමේදී ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ තත්වය, වයස වැනි කාරණාවලදී සියලු දෙනාට සමාන අවස්ථා ලබාදෙමින් කටයුතු කෙරේ.

**iv. විශ්වාසය -**

රාජකාරි කටයුතු ඉෂ්ට කිරීමේදී ආයතනයේ ඉහළ කළමණාකාරිත්වයේ සිට පහලම සේවකයා දක්වාම විශ්වාසය ආරක්ෂා වන අයුරින් හැකි උපරිම කැපවීමෙන් අදාල කටයුතු සිදු කරයි.

**v. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය -**

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් තම සේවාලාභීන්ට සේවාවන් සැපයීමේදී ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය කිරීම සහ එය එසේ සිදුවන්නේ ද යන්න අධීක්ෂණය පිණිස ශක්තිමත් රාමුවක් සකස් කර තිබීම විශේෂත්වයකි. ආයතනය තුල සිටින නිලධාරින් සංඛ්‍යාව සැලකූ විට එයින් බහුතරය කාන්තාවන් වන අතර ස්ත්‍රී, පුරුෂ යන දෙපාර්ශවයම සමාන අයිතිවාසිකම් හා වරප්‍රසාද සඳහා හිමිකම් ලබයි.

**vi. සේවා ලාභී කේන්ද්‍රීයත්වය -**

ආයතනයේ සේවාවන් ලබා දීමේදි සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් සහ හැකි උපරිම මට්ටමෙන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටුවන අයුරින් ආයතනයේ සියළු දෙනාම කටයුතු කිරීම අප සතු තවත් අගයකි. ආයතනයේ සියළු වැඩසටහන් හා කාර්යයන් සැලසුම් කිරීමේ දි සේවාලාභී කේන්ද්‍රීයත්වය පිළිබඳව විශේෂයෙන් සලකා බැලේ.

**vii. පරිසර හිතකාමිත්වය -**

ආයතනයේ සේවාවන් ලබා දීමේදී සම්පත් නාස්තිය අවම කරමින්, පරිසරයට වන හානිය අවම කිරීමට පරිසර සංරක්ෂණය ඉලක්ක කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම මෙන්ම පරිසර හිතකාමි ගොවිතැන ප්‍රවර්ධනය කිරීම මගින්ද ආයතනයේ පරිසර හිතකාමිත්වය ප්‍රදර්ශනය කෙරේ.

**viii. විනිවිදභාවය -**

ආයතනයේ සියළුම නිලධාරින් තමාට පැවරුණු රාජකාරි ඉටු කිරීමේ දී ආයතන සංග්‍රහය, මුදල් රීති සංග්‍රහය, චක්‍රලේඛ ආදියට අනුගතව ඉතා විනිවිද භාවයකින් යුතුව තම කටයුතු ඉටු කරන අතර තොරතුරු දැන ගැනීමේ පනත හරහා අවශ්‍ය තොරතුරු ජනතාවට ලබා දීමට බැදී සිටී



# පරිච්ඡේදය - 03
# ආයතනයේ අභ්‍යන්තර පරිසරය හා තත්ව විශ්ලේෂණය
# ORGANIZATIONAL INTERNAL ENVIRONMENT & SITUATIONAL ANALYSIS

## 3.1 සංවිධාන ව්‍යුහය

### 3.1.1. මානව සම්පත

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය 54 ක කාර්යමණ්ඩලයකින් යුක්ත වේ. ඉහළපෙළ කළමණාකාරිත්වය හා ආයතන ප්‍රධානියා ලෙස අමාත්‍යාංශ ලේකම් කටයුතු කරයි. සියළුම ආයතනික පරිපාලන කළමණාකරණය හා සංවර්ධන කටයුතු මෙන්ම ගිණුම් කටයුතු වලට අදාළව ප්‍රධාන ගනන් දීමේ නිලධාරියා වශයෙන් අමාත්‍යාංශ ලේකම් වගකීම දරයි.

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආයතන, ගිණුම් හා සංවර්ධන ලෙස අංශ 03 ක් සමන්විත වේ. එහි ආයතන අංශය දෙවන පෙළ කළමනාකරුවන් වශයෙන් ක්‍රියාකරන සහකාර ලේකම්වරුන් දෙදෙනෙකුගේ නායකත්වය යටතේ පවතින අතර, ආයතන අංශය තුළ නිළධාරින් 18 දෙනෙකු සේවයේ නිරත වේ.

සංවර්ධන අංශයේ දෙවන පෙළ කළමනාකරුවන් වශයෙන් සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පදාන) නිලධාරින් දෙදෙනෙකු සිටින අතර, ඔවුන් යටතේ සංවර්ධන නිලධාරින් 15 හා එක් කාර්යාල සහායකයෙකු සේවයේ නිරත වේ.

ගිණුම් අංශය දෙවන පෙළ නායකත්වය දරන්නේ ගණකාධිකාරී විසිනි. මීට අමතරව නිලධාරින් 11 ක් ගිණුම් අංශය තුල සේවයේ නිරත වේ
**(ඇමිණුම 01 - අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය, ඇමිණුම 02 - කාර්යමණ්ඩල විස්තර තනතුර අනුව )**

ඉහතින් විස්තර කර ඇත්තේ අමාත්‍යාංශය තුල දැනට සිටින කාර්ය මණ්ඩලයයි. 2020 - 2024 සඳහා පිළියෙල කරන පස් අවුරුදු සැලැස්මේ සැලසුම් සකස් කිරිම හා ප්‍රගති පාලනය සඳහා දැනට සිටින සංවර්ධන ව්‍යුහයට වඩා වෙනස් ව්‍යුහයක් යෝජනා කරනු ලැබේ. විශේෂයෙන්ම යෝජිත සංවිධාන ව්‍යුහය නව ව්‍යාපෘති මෙහෙයවීම් හා ඇගයීම් ඒකකයක් ස්ථාපිත කිරිම සහ තොරතුරු තාක්ෂණ නිලධාරින් වැඩි ප්‍රමාණයක් බඳවා ගැනිමට කටයුතු කිරිම යෝජනා කරනු ලැබේ.
**(ඇමිණුම 03 – යෝජිත සංවර්ධන ව්‍යුහය)**

## 3.2 අලෙවිකරණ පරිසරය

දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමූපකාර අමාත්‍යාංශය ප්‍රධාන වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලියක නිරත නොවුවද බාහිර හා අභ්‍යන්තර පාරිභෝගික ප්‍රජාව වෙත අමාත්‍යාංශයට අයත් පහතින් විස්තර කරන ලද අංශ 7 හරහා විවිධාකාරවූ සේවාවන් සැපයීම සිදුකරයි. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර සේවාලාභීන් වන අතර දකුණු පළාතේ විසිරී සිටින ගොවීන්, කෘෂිපාදක ව්‍යවසායකයින්, වෙළෙඳ ප්‍රජාව ජල පාරිභෝගිකයින් පාසල් දරුවන් ඇතුළු අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වන ජනතාව බාහිර සේවාලාභීන් ලෙස දැක්විය හැක.

අමාත්‍යාංශයට අයත් අංශ 7 මගින් සේවාලාභීන් වෙත සපයන සේවාවන් පහත පරිදි සවිස්තරාත්මකව දැක්විය හැක.

| අංශය | සේවාවන් |
|---|---|
| **ආයතන** | • අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුල සේවය කරන නිලධාරීන්ගේ බඳවා ගැනීම, උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම, විනය පාලනය යන කටයුතු වලදී අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br>• නිලධාරීන් පුහුණු කිරීම තුලින් මානව සම්පත් සංවර්ධනය කිරීම |
| **සංවර්ධන** | • අමාත්‍යාංශයට අයත් විෂය පථයට අදාළ සංවර්ධන සැලැසුම්කරණය හා අදාළ කටයුතු ඉටු කිරීම.<br>• දත්ත හා තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම හා සංවර්ධන සැලැසුම්කරණයේදී අදාළ පාර්ශවයන්ට අවශ්‍ය දත්ත හා තොරතුරු සැපයීම |
| **ගිණුම්** | • මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම හා වියදම් වාර්තා කිරීම<br>• ප්‍රසම්පාදන කටයුතු<br>• වත්කම් පාලනය<br>• විගණන සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම |
| **ජල සම්පාදන හා ජලාපවහන** | • ජල නල දිගු ලබා දීම<br>• ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>• ජලයේ ගුණත්වය පිළිබඳ රසායනික පරීක්ෂාවන් සිදු කිරීම<br>• ජල දූෂණය වීම වැලැක්වීම පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම<br>• ජල පෙරණ උපකරණ පද්ධති ලබා දීම<br>• වැසි ජල කළමණාකරණ පද්ධති ලබා දීම<br>• ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල මනු ලබා දීම |
| **ආහාර සැපයුම්** | • නවෝත්පාදක ආහාර වර්ග හඳුන්වාදීම<br>• අගය එකතු කළ නිෂ්පාදන සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණු<br>• කල්තබා ගත හැකි ආහාර වර්ග නිෂ්පාදන පුහුණු<br>• ආකර්ෂණීය ඇසුරුම් පළමු තොගයට 50%ක සහනාධාරයක් ලබාදීම<br>• නවීන ඇසුරුම්කරණ යන්ත්‍ර සූත්‍ර සඳහා 50%ක සහනාධාරයක් ලබාදීම<br>• ආකර්ෂණීය ලේබල් සඳහා 50%ක සහනාධාරයක් ලබාදීම<br>• ආහාර නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර සඳහා 50%ක සහනාධාරයක් ලබාදීම |

| | |
|---|---|
| **වෙළෙඳ** | • ව්‍යාපාර නාම ලියාපදිංචිය<br>• වෙළෙඳ ව්‍යවසායකයින් සඳහා 50% සහනාධාරයක් යටතේ තාක්ෂණික උපකරණ<br>• ව්‍යවසායකයින් සඳහා GMP සහතිකකරණය ලබාදීම.<br>• ආපනශාලා ශ්‍රේණිගත කිරීම. |
| **කෘෂිපාදක සංවර්ධන ප්‍රදාන** | • නොමිලේ ව්‍යවසායකත්ව පුහුණුව<br>• තාක්ෂණික පුහුණු<br>• ක්ෂේත්‍ර නිරීක්ෂණ අවස්ථා<br>• ප්‍රදර්ශන සඳහා සහභාගී වීමේ අවස්ථා<br>• තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සඳහා 50%ක සහනාධාරයක් |

## 3.2 මූල්‍ය පරිසරය

### 3.3.1 සංවර්ධන කටයුතු සඳහා මූලධන ප්‍රතිපාදන

- අමාත්‍යාංශය වෙත ලැබෙන මුදල් ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස කාණ්ඩ 02 කට බෙදා දැක්විය හැක.
- සංවර්ධන කටයුතු සඳහා මූලධන ප්‍රතිපාදන

| මූල්‍ය ප්‍රභවය | වෙන්වූ ප්‍රතිපාදන (රු.මි.) | | |
|---|---|---|---|
| | 2016 | 2017 | 2018 |
| **පළාත් නිශ්චිත** | 240.40 | 137 | 162 |
| **උපමාන පාදක** | 66.50 | 256.70 | 270 |
| **වෙනත්** | 21 | 21 | 35 |
| **එකතුව** | **327.9** | **414.7** | **467** |

සාපේක්ෂව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය සීමා වීම නිසා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාවය  අනුව තෝරා ක්‍රියාත්මක කිරීම සිදු කරයි

## 3.3.2 පුනරාවර්තන ප්‍රතිපාදන

| වැය විෂය විස්තරය | ප්‍රතිපාදන (රු.මි.) | | |
|---|---|---|---|
| | 2016 | 2017 | 2018 |
| ව්‍යාපෘතිය 1 - අමාත්‍ය කාර්යාලය | | | |
| පුනරාවර්තන | 20,564,522.00 | 17,937,000.00 | 15,422,000.00 |
| ප්‍රාග්ධන | 500,000.00 | 800,000.00 | 800,000.00 |
| ව්‍යාපෘතිය 2 - අමාත්‍යාංශ කාර්යාලය | | | |
| පුනරාවර්තන | 14,200,000.00 | 9,126,000.00 | 8,881,000.00 |
| ප්‍රාග්ධන | 253,500,000.00 | 171,050,000.00 | 207,793,900.00 |
| එකතුව | **288,764,522.00** | **198,913,000.00** | **232,896,900.00** |

## 3.3 ප්‍රස්තාරය - සංවර්ධන කටයුතු සඳහා මූලධන ප්‍රතිපාදන හා පුනරාවර්තන ප්‍රතිපාදන වෙන්ව ඇති ආකාරය




මූල්‍ය කළමනාකරනයේ දී පුනරාවර්තන වියදම් මේ ලෙස වෙන්වී තිබුණත් ප්‍රතිපාදන ඉතිරිව වැය විෂයන්ගෙන් ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන්ට ප්‍රතිපාදන ලබා දෙමින් පුනරාවර්තන වියදම් ප්‍රතිපූර්ණය කිරිම.

## 3.4 තාක්ෂණික මෙහෙයුම් පරිසරය

- දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් තම අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් වෙත දැනට ලබා දෙන සේවාව තවදුරටත් කාර්යක්ෂමව, නිවැරදිව ලබා දීමටත්, බිම් මට්ටම දක්වා වඩාත් ජනතාව අතර ප්‍රචලිත කිරීමටත්, දැනට භාවිතා කරන ක්‍රමවේදයන්ට වඩා නවීන තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කිරිම හා පද්ධති සංවර්ධනය (system development) කිරිම ඉදිරි වසර 05 තුළදී සිදු කිරිමට අපේක්ෂිතයි.
- දැනට පවතින සේවාවන් සඳහා ගතවන කාලය අවම කිරිමට හා කඩදාසි අනවශ්‍ය ලෙස භාවිතය අවම කිරීම සඳහා හදුනාගත් සේවාවන් රැසක් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් online සේවාවන් ලෙස පවත්වා ගෙන යාමට අපේක්ෂා කෙරේ. මීට අමතරව කාර්යාලය තුළ ඊ තැපැල, ඉලෙක්ට්‍රොනික ලේඛනාගාරය (E – record room), ඉලෙක්ට්‍රොනික ගබඩාව (E – stores) වැනි සන්නිවේදන මෙවලම් භාවිතය තුලින් සේවාවන් වඩාත් කඩිනම් කිරිම හා නිරවද්‍ය කිරිම සිදු කරනු ලැබේ.
- තවද ජනතාව සමග වඩාත් සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය හා අමාත්‍යාංශය මුහුණු පොත යාවත්කාලීන කිරිමද සිදු කරනු ලැබේ.
- එසේම අභ්‍යන්තර සේවාලාභීන්ගේ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරිම හා නියාමනය කිරීම සිදු කරනු ලැබේ.

## 3.5 වත්කම් ( other assets )

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවලට අයත් වත්කම් පහතින් දක්වා ඇත.

| වත්කම් | කෘෂිකර්ම අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සමූපකාර දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|
| **යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ** | | | | |
| මගී ප්‍රවාහන | 92,150,000.00 | 44,886,700.00 | 16,279,900.00 | 34,921,918.00 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | | | | 17,390,500.00 |
| කෘෂිකාර්මික වාහන | | | | 4,587,200.00 |
| යතුරුපැදි | 97,899.00 | 42,825.00 | - | 85,000.00 |
| කාර්යාලයීය උපකරණ | 6,918,856.00 | 449,903.00 | 4,854,488.00 | 5,713,736.00 |
| පරිගණක උපකරණ | 8,525,648.00 | 15,324,083.00 | 4,944,067.00 | 26,269,664.00 |
| විද්‍යුත් උපකරණ | 1,056,166.00 | 482,411.00 | 145,033.00 | 2,730,101.00 |
| සන්නිවේදන උපකරණ | 393,383.00 | 512,588.00 | 454,170.00 | 3,829,273.00 |
| ගෘහ භාණ්ඩ | 509,939.00 | 6,134,130.99 | 34,800.00 | 12,841,748.00 |
| ක්‍රීඩා උපකරණ | 40,225.00 | | | |
| කෘෂිකාර්මික සහ කිරිගොවිපළ උපකරණ | | | | 3,200,527.00 |
| කාර්මික හා නිෂ්පාදන උපකරණ | | | | 20,414,286.00 |
| පොත් සහරා සහ ජ'නල | | 61,706.00 | | |
| ඉදිකිරීම් උපකරණ | | 40,706,686.00 | | |
| විකාශන උපකරණ | | | 222,580.00 | 909,525.00 |
| ගිනි නිවීමේ උපකරණ | | | 65,838.00 | |
| **ගොඩනැගිලි හා ඉදි කිරීම්** | | | | |
| කාර්යාල ගොඩනැගිලි | | | 1,430,036.00 | 29,908,288.00 |
| නිල නිවාස | | | | 14,221,461.00 |
| ගොවිපොළ | | | | 190,578,026.00 |

| | | | | |
|---|---|---|---|---|
| හා කෘෂිකර්මය ආශ්‍රිත වත්කම් | | | | |
| බඩු ගබඩාව | | | | 2,517,000.00 |
| සංචාරක බංගලා | | | | 6,770,000.00 |
| | | | | |
| පරිගණක මෘදුකාංග | - | 2,521,950.00 | - | - |
| **නැවත නැවත ජනනය නොවන වත්කම්** | | | | |
| ජලය | | 5,812,000.00 | | |
| ඉඩම් | | | | 337,550,000.00 |
| **එකතුව** | **109,692,116.00** | **116,934,982.99** | **28,430,912.00** | **714,438,253.00** |




# පරිච්ඡේදය - 04
# බාහිර පාරිසරික විශ්ලේෂණය
# EXTERNAL ENVIRONMENT ANALYSIS

**ආයතනය සඳහා බලපානු ලබන බාහිර පාරිසරික තත්වයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා PESTEL විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී.**

## 1) දේශපාලනික

කෘෂිකාර්මික හා කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය සඳහා අනුගත වූ ජාතික ප්‍රතිපත්තීන්ට දේශපාලනික වශයෙන් වැඩි ප්‍රමුඛතාවයක් පැවතීම මේ යටතේ ප්‍රධාන කාරණයක් ලෙස සැලකිය හැක. මෙහිදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව්‍යකරණ වැඩසටහන, Enterprises Sri Lanka වැනි පුළුල් දැක්මක් සහිත ජාතික තලයේ වැඩසටහන් පැවතීම සාධනීය ලක්ෂණයකි. 2019-04-10 දින දකුණු පළාත් සභාව විසුරුවා හැරීමත් සමග මෙම අවස්ථාව වන විට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අධීක්ෂණය යටතේ අමාත්‍යාංශය පවත්වා ගෙන යයි. ඇතැම් අවස්ථාවන්හිදී විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යාමේදී පළාත් සභාව හා රේඛීය අමාත්‍යාංශය අතර පවතින දේශපාලනික අර්බුදකාරී තත්වයන් ද දේශපාලනික බලපෑමක් ලෙස හඳුනාගත හැකිය. දේශපාලනඥයින් සියළු දෙනාම කෘෂිකර්මාන්තයට දැඩි කැමැත්තක් දැක්වීම හා බිම් මට්ටමේ ප්‍රතිලාභීන් සම්බන්ධ කිරීම් සඳහා මැදිහත්වීමද දැකිය හැකි ලක්ෂණයකි.

## 2) ආර්ථිකමය

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනය කෙරෙහි කෘෂිකර්ම අංශය දක්වන දායකත්වය 6.9% වැනි අඩු අගයක පැවතියද ශ්‍රම බලකායෙන් 26%ක් වැනි සැලකිය යුතු ප්‍රතිශතයක් කෘෂිකාර්මික නිෂ්පාදන ආශ්‍රිත රැකියාවල නිරත වේ. ප්‍රාථමික කෘෂිකර්මය පදනම් කරගත් සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිශතය අඩු කිරීම කෘෂිපාදක සේවාවන් වැඩි දියුණු කිරීමත්, තුළින් දළ ජාතික නිෂ්පාදිතයට කෘෂිකර්මාන්තයෙන් දක්වන දායකත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

## 3) සමාජයීය

ශ්‍රී ලංකාවේ මෙන්ම දකුණු පළාතේ තරුණ ප්‍රජාව කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ක්‍රම ක්‍රමයෙන් ඈත් වීම ප්‍රබල සමාජමය ගැටළුවක් ලෙස හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත තාක්ෂණයන් කාලානුරූපීව වෙනස් නොවීම, ඇතැම් විට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියාවන් ලාභදායි නොවීම හා කෘෂිකර්මාන්තය කෙරෙහි පවතින සමාජ පිළිගැනීම ක්‍රමයෙන් හීනවීම මීට හේතුව සාධක වශයෙන් හඳුනාගත හැක.

තවද ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික, වාරිමාර්ග, වෙළෙඳ, ජල සම්පාදන වැනි විෂයය පථයන් තුල ක්‍රියාත්මක වන විවිධ ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවය දුර්වල මට්ටමක පැවතීම සමාජීය ලෙස අයහපත් ලෙස බලපායි.

## 4) තාක්ෂණික

ලෝකයේ සෙසු රටවල් හා සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාවේ අධිතාක්ෂණික ශක්‍යතාවයෙන් යුතු භාවිතයන් ඉතා අඩු මට්ටමක පවතී. උදා. ජපානය වැනි රටවල

භාවිතාවන ස්වයංක්‍රීය වගා ගෘහ (Fully Automated Poly tunnel) කෘෂිකාර්මික වගා තාක්ෂණය සඳහා රොබෝ තාක්ෂණය යාන්ත්‍රිකරණය භාවිතා කිරීම. අධි තාක්ෂණික ශීතාගාර හා ගබඩා පහසුකම් පැවතීම. වගාව ආරම්භයේ සිට අවසානය දක්වා පාරිභෝගිකයා අතට පත්වන තුරු වන හානිය වැළැක්වීම. අතිරික්ත ආහාර පරික්ෂණය සඳහා නවීන තාක්ෂණය සහ පසු අස්වනු කළමණාකරණය සඳහා නවීන තාක්ෂණය භාවිතාව ලංකාව වැනි රටවල ඉතා අඩු මට්ටමක පවතී. යාන්ත්‍රිකරණය නිසා කෘෂි ඵලදායිතාව අඩුවන අතර වියදම වැඩිවී නිෂ්පාදන පිරිවැය වැඩිවේ. අගය එකතු කල කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව ජනතාව තුළ පවතින දැනුවත්භාවය අඩුවීම ද තාක්ෂණික බලපෑම් ඇතිකරන කාරණයකි.

## 5) පාරිසරික

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසයන් (ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම) නිසා සෘණාත්මක බලපෑම්වලට ගොදුරු වීමේ සම්භාවිතාව අතින් ලංකාව මුල් 5 අතර ඉතා ඉහළ මට්ටමක පැවතීම, ස්වාභාවික ආපදා නායයෑම්, ගංවතුර ආදිය නිසා කෘෂිකර්මාන්තයට බලපෑම් එල්ලවීම, විවිධ මානව ක්‍රියාකාරකම් හා සංවර්ධන වැඩසටහන් හේතුවෙන් පළාත තුළ පිහිටි ස්වාභාවික ජල මූලාශ්‍ර දූෂණය වීම, කෘෂිකාර්මික කටයුතු වෙනුවට මෙම වැවිලි බෝග හා කටයුතු සඳහා වැඩි වශයෙන් ඉඩම් පරිහරණ රටාව වෙනස්වීම පාරිසරික කාරණා වශයෙන් හඳුනා ගන්නා ලදී.

## 6) නීතිමය

අමාත්‍යාංශ විෂය පථයට අදාළව (විශේෂයෙන් කෘෂිකර්ම) පවතින නීති රීති, අණපනත් ආදිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හා වෙනත් ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීමේදී රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් නීතිමය බලතල නොමැතිවීම නීතිමය බලපෑම් යටතේ හඳුනා ගන්නා ලදී. උදා - පුරං වූ කුඹුරු (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව) සේනා දළඹුවා මර්දනයට මහජන සෞඛ්‍ය පරීක්ෂකහට බලය ලබා දී තිබුනද, කෘෂිකර්ම උපදේශකහට ඒ සඳහා බලය ලබා දී නොතිබීම වැනි නීතිමය කාරණා සඳහා ලබා දී ඇති බලතල ප්‍රමාණවත් නොවීම.

තවද, දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම ස්ථාපිත කර ගැනීම සඳහා මේ වන විට ප්‍රඥප්ති 05ක් පිළියෙල කර අනුමත කර රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත. දකුණු පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය, දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය, දකුණු පළාත් සමූකාර සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත, දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්ති කෙටුම්පත, ව්‍යාපාර නාම ප්‍රඥප්ති කෙටුම්පත යන ප්‍රඥප්ති මේ වන විට දකුණු පළාත තුළ බලගන්වා ඇත.

දකුණු පළාත් කෘෂිකර්ම ගොවිජන සංවර්ධන ..... අමාත්‍යාංශය යටතේ වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය යන අංශයන් සඳහා ද බාහිර පාරිසරික සාධක හඳුනා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් PESTEL විශ්ලේෂණය භාවිතා කළ අතර, **ඇමිණුම 04** මගින් ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දක්වා ඇත.




# පරිච්ඡේදය 05
# පසුගිය වර්ෂයන්හි කාර්යසාධන සමාලෝචනය
# PERFORMANCE REVIEW OF PAST THREE YEARS

## 5.1 වර්තමාන තත්වය (current status)

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු, වාරිමාර්ග දෙපාර්තමේන්තු, සමූපකාර දෙපාර්තමේන්තු, ජලසම්පාදන විෂය, ආහාර සැපයුම් විෂය, වෙළෙඳ විෂය හා කෘෂිපාදක විෂයයන් සඳහා 2014 වසරේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමේදී වෙන් වෙන් වශයෙන් විෂය ක්ෂේත්‍රය (scope) හඳුනා ගන්නා ලදී.

එසේ හඳුනාගත් ඉලක්ක වෙත ළඟා වීමට ඒ ඒ අංශ මගින් ඉටු කරන ලද කාර්යයන් සහ එහි වර්තමාන තත්වය පහත සඳහන් කර ඇත.

### <u>කෘෂිකර්ම අංශය</u>

බෝග නිෂ්පාදන, ඵලදායිතාව හා ගුණාත්මකතාවය වැඩි දියුණු කිරීම සඳහා දකුණු පළාත තුළ වගා කරන බෝගයන්හි වපසරිය වැඩි කිරීම, එක් එක් බෝගය සඳහා සාමාන්‍ය අස්වැන්න වැඩි කිරීම, කාබනික කෘෂි නිෂ්පාදන සුලභකිරීමෙන් පරිසර හිතකාමී බෝග වගාවට යොමුවීම, බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය උසස් කිරීම වැනි උපායමාර්ගයන් තුලින් ඉහත අරමුණු කරා ලගා වී ඇත.

එමෙන්ම දකුණු පළාතේ ගොවි ජනතාව වෙත කාර්යක්ෂම ව්‍යාප්ති සේවාවන් ලබාදීම සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම, නවීන කෘෂි තාක්ෂණය වේගවත් ලෙස ගොවීන් අතරට ගෙන යාමට නව ක්‍රමවේද යොදා ගැනීම, ව්‍යාප්ති අංශයේ ධාරිතාවය වැඩි කිරීම යන ක්‍රමවේද යොදාගත් අතර මේ වන විට අදාළ ඉලක්ක වෙත ළඟා වී සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ඇත.

### <u>වාරිමාර්ග අංශය</u>

දකුණු පළාතේ වැව් අමුණු ඇළ මාර්ග යොදා ගෙන කලාපයේ වගා කුඹුරුවලට අවශ්‍ය ජලය සැපයීම සඳහා හොඳින් ස්ථාපනය වු මුලස්ථායි හා අදාළ පද්ධති ස්ථාපනය කිරීම ඉඩම් ගංවතුරින් ආරක්ෂා කිරීම, සංරක්ෂණය හා ආරක්ෂණය කරන ලද වාරි රක්ෂිත හා ජල පෝෂිත ප්‍රදේශ ඇති කිරීම, ජලජ පැළෑටි වලින් තොරවූ ජල ධාරක ප්‍රදේශ ඇති කිරීම, ජලජ පැළෑටි වලින් තොරවූ ජල ධාරක ප්‍රදේශ ඇති කිරීම වැනි උපායමාර්ගයන් තුලින් ඉහත අරමුණු සාක්ෂාත් කරගෙන ඇත.

තවද නව තාක්ෂණික උපක්‍රම හා තත්ව පාලන උපක්‍රම යොදා ගැනීම තුලින් ඉදිකිරීම් තත්වයන් වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය සහිත කාර්යමණ්ඩලය, පුහුණු කිරීම, කළමණාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම, ජල විද්‍යා දත්ත එකතු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම, පාර්ශ්වකරුවන් හා ආයතන අතර දුරස්ථභාවය අඩු කිරීම සඳහා සන්නිවේදනය වැඩි කිරීම මගින් ආයතන ධාරිතාව ඉහළ නැංවීම හා මහජන පිළිගැනීම වැඩිකරන ලදී.

## සමූපකාර අංශය

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ යහපාලනය සහ ආයතනික හා මානව සංවර්ධන ධාරිතාවය නැංවීම තුලින් සංවර්ධනය සඳහා දැනුම, කුසලතාව හා ආකල්ප වලින් පරිපුර්ණ වූ සමූපකාරිකයන් බිහි කිරීම, සමූපකාර අගයන් ප්‍රවර්ධනය බිහි කිරීම, භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනයක් බිහිවූ සමූපකාර ක්ෂේත්‍රයක් බිහි කිරීම, සාමාජික ප්‍රවර්ධනය තුලින් ඉහළ ප්‍රතිලාභයක් ලබන සමූපකාර සාමාජිකයින් පිරිසක් ඇති කිරීම, නව සමූපකාර සමිති පිහිටුවීම යන අරමුණු සාක්ෂාත් කර ගන්නා ලදී. තවද කළමණාකරණය හා නෛතික කටයුතු තුලින් මනා කළමණාකරණයකින් හා පරිපාලනයකින් යුතු සමූපකාර ව්‍යාපාරයක් බිහි කිරීම, නව සංවර්ධන ප්‍රවේශ තුලින් නව තාක්ෂනය හා ඒකාබද්ධ වූ සමූපකාර ක්ෂේත්‍රයක් ගොඩනැගීම, සමූපකාර නිෂ්පාදන සේවා විවිධාංගීකරණය හා අලෙවිකරණය ඉහළ නැංවීම තුලින් අනෙකුත් අංශ සමග තරඟ කළ හැකි ඉහළම වෙළෙඳපොල කොටස් සහිත නිෂ්පාදන හා සේවා අංශයක් ඇතිකරන ලදී.

## ආහාර සැපයුම් අංශය

ආහාර අපතේ යාම අවම කිරීම තුලින් දකුණු පළාත තුල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජනතාවට ප්‍රමිතිගත ආහාර සැපයුමක් සහතික කිරීම සඳහාත් ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ තාක්ෂණික පරිවර්තනයන් සිදු කිරීම තුලින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා විවිධ උපායමාර්ගයන් ඔස්සේ අමාත්‍යාංශය විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ආහාරවල සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා දැනුවත් කිරීම් සිදු කිරීම, තාක්ෂණික උපකරණ ලබාදීම, අගය එකතු කළ නිෂ්පාදන සඳහා යොමු කිරීම වැනි උපායමාර්ග අනුගමනය කර සාර්ථක ප්‍රතිඵල අත් කරගන්නා ලදී. මේ යටතේ ඇඹිලිපිටිය කැතිරීච් ආයතනය, සේවා සංස්කරණ අභ්‍යාස ආයතන, රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය වැනි ආයතන සම්බන්ධ කරගනිමින් 2018 වර්ෂයේ ප්‍රතිලාභීන් 120කට ආසන්න ප්‍රමාණයක් ද, 2017 වර්ෂයේ ප්‍රතිලාභින් 232කට ආසන්න ප්‍රමාණයක්ද සඳහා පුහුණු වීම් පවත්වා ඇත. එමෙන්ම පසුගිය වසර පහ තුළ වාර්ෂිකව ව්‍යවසායකයින් 50ක් බැගින් දිවයිනේ පිහිටි ප්‍රමුඛ පෙළේ ආහාර නිෂ්පාදන ආයතන වෙත ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා රැගෙන යාම තුලින් ඔවුන්ගේ දැනුම ඉහළ නංවන ලදී. තවද සෞඛ්‍යාරක්ෂිත දේශිය ආහාර පරිභෝජන රටාවක් පළාත තුළ ස්ථාපිත කිරීම සඳහා පාසල් දරුවන් දැනුවත් කිරීම, ආහාර ප්‍රදර්ශන සංවිධානය කිරීම වැනි කටයුතු සාර්ථක ලෙස පසුගිය වර්ෂ 5 තුළ සිදුකරන ලදී . එමෙන්ම ආහාර නිෂ්පාදන ආශ්‍රිත නව තාක්ෂණය ව්‍යවසායකයින් වෙත ගෙන යාමත්, නවෝත්පාදක ආහාර නිෂ්පාදනයන් හඳුන්වාදීමත්, ගොවිපල ආහාර නිෂ්පාදන ඒකකයන් සඳහා නවීන තාක්ෂණික යන්ත්‍රෝපකරණ භාවිතයන් වැඩිදියුණු කිරීමත් සිදුකරන ලදී.

## ජල සම්පාදන අංශය

ජල සම්පාදන විෂය යටතේ පානීය ජල සම්පාදනය ඵලදායිව සිදු කිරීම සඳහා ජල සම්පාදන ක්‍රම ස්ථාපනය කිරීම, නළ ළිං, නව ජල මූලාශ්‍ර භාවිතයෙන් ප්‍රජා ජල ව්‍යාපෘති ඇති කිරීම තුලින් වසර පුරා ජල සැපයුම තහවුරු කිරීම, පාසල් සිසුන් දැනුවත් කිරීම තුලින් අහිතකර මානව ක්‍රියාකාරකම් අඩු කිරීම තුලින් ජලය දූෂණය අවම කිරීම, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිසි ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම, නිසි ක්‍රමවේදයක් තුලින් ජලය එක්රැස්වීම අවම කර ජලය මගින් බෝවන රෝග පාලනය කිරීම, ගුණත්වය පරීක්ෂා කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් පානීය ජලයේ ගුණත්වය ආරක්ෂා කිරීම සහ වන වගා වැඩසටහන් ක්‍රියාත්මක

කිරීම තුලින් ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම ඇතුළු පරිසර හිතකාමී පරමාර්ථයන් මුදුන්පත් කර ගන්නා ලදී.

## වෙළෙඳ අංශය

දකුණු පළාත් වෙළෙඳ ප්‍රජාවට ප්‍රශස්ථ ලෙස සේවා සැපයීම සඳහා මෙතෙක් අඩුපාඩුවක්ව පැවති ප්‍රඥප්තියක් වෙළෙඳ විෂයට අදාළව සකස් කර ගැනීමට ලැබීම පසුගිය වර්ෂ කිහිපය තුළ අමාත්‍යාංශය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. එමෙන්ම වාර්ෂිකව දකුණු පලාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් සංඛ්‍යාත්මකව විශාල වශයෙන් ඉහළ නැංවීමට හැකිවීමද, තවත් සුවිශේෂී කරුණකි. 2017 වර්ෂය සඳහා වෙළෙඳ ව්‍යාපාර නාම ලියාපදිංචිය 7092ක්ද, 2018 වර්ෂය සඳහා වෙළෙඳ ව්‍යාපාර නාම ලියාපදිංචිය 8962ක් ද සිදු කරන ලදී. වෙළෙඳ ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා අන්තර්ජාලය හරහා ව්‍යාපාර ලියාපදිංචිය (EBR) සඳහා පහසුකම් සැපයීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයකි.

## කෘෂිපාදක අංශය

කෘෂිපාදක ව්‍යවසායකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, ව්‍යවසායක පුහුණු, තාක්ෂණික පුහුණු, හොඳම ව්‍යවසායකයින් තේරීමේ තරග, ADTU සම්පත් දායකයින් සංවර්ධනය, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, තාක්ෂණික පුහුණු හා 50% මුලා පදනම මත කෘෂි තාක්ෂණික උපකරණ ලබාදීම යන ව්‍යාපෘති මෙම විෂය හරහා ක්‍රියාත්මක කෙරේ.

2018 වර්ෂයේදී 1100කට ආසන්න පිරිසක් දැනුවත් කරනු ලැබූ අතර 616ක් වූ ව්‍යවසායක පිරිසකට කෘෂි ව්‍යවසායක පුහුණුව ලබා දෙන ලදී. 70කට ආසන්න නිලධාරීන් පිරිසක් ADTU ඒකකයේ සම්පත්දායකයින් ලෙස පුහුණු කරනු ලැබූ අතර ප්‍රතිලාභීන් 125කට තාක්ෂණික පුහුනු ලබා දී ඇත. ප්‍රතිලාභීන් 180කට පමණ ප්‍රදර්ශනවලට ඉවත් වීමට අවස්ථාව සැලසුණු අතර 318ක් ක්ෂේත්‍ර චාරිකා සඳහා යොදවා ඇත. 50% මුලා පදනම මත 249කට තාක්ෂණික උපකරණ ලබා දී ඇත. මෙහිදී ප්‍රධාන වශයෙන් බිම්මල් කර්මාන්තය, කොම්පෝස්ට්, තුනපහ, පොල්තෙල් හා මල් වගාකරුවන් සඳහා දැල් ඇතුළු තාක්ෂණික පරිවර්තනයන් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා දෙන ලදී. 2016 දී යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබද වැඩි යොමුවීමක් නොතිබූ බිම්මල් ක්ෂේත්‍රයේ මෙම වැඩසටහන හරහා මේ වන විට යාන්ත්‍රීකරණයට විශාල වශයෙන් යොමු වී ඇත.

## 5.2 මෙහෙයුම් සමාලෝචනය (Operational Review)

**අපේ ගමනේ සංධිස්ථාන**

2014-2019 දක්වා පසුගිය වර්ෂ 5ක කාල සීමාව තුළ දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පසු කරන ලද සුවිශේෂී සංධිස්ථානයන් කිහිපයක් පහත දැක්වේ.

### 1) ISO තත්ත්ව සහතික ලබා ගැනීම

**ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබාගැනීම - දකුණු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග... අමාත්‍යාංශය**

අමාත්‍ය මණ්ඩල සංදේශ 600:1 යටතේ සෑම රජයේ ආයතනයක්ම ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබාගත යුතු අතර මෙම අමාත්‍යාංශය 2015 වර්ෂයේ ජනවාරි මස මෙම ව්‍යාපෘතිය ආරම්භ කල අතර Quality Trilogy Consultancy & Training Services ආයතනයේ උපදේශකත්වය යටතේ 2016 ජූලි 13 වන දින කෘෂිකර්ම අමාත්‍යාංශයට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ISO 9001:2008 තත්ත්ව සහතිකය හා 2018 වර්ෂයේදී ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා ගැනීමට හැකි විය.

ISO 9001:2015 තත්ත්ව සහතිකය යටතේ මෙම අමාත්‍යාංශය සිදුකරනු ලබන සියළුම කාර්යයන්ට අදාළව අවධානම් හඳුනාගෙන ඊට අදාළ පිළියම් ලබා දීම හා ඒ මගින් ඇතිවන අවස්ථා හඳුනා ගැනීම තුලින් අප අමාත්‍යාංශය සපයනු ලබන සේවාවන් ජාත්‍යන්තර ප්‍රමිතිකරණයට අනුකූල බවට සහතික කරයි.

### 2) දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාල ප්‍රඥප්ති

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සඳහා ප්‍රඥප්ති 05ක් ස්ථාපිත කිරීමට මේ වන විට අමාත්‍යාංශයට හැකියාව ලැබී ඇත. දකුණු පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය, දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය, දකුණු පළාත් සමුපකාර සංවර්ධන ප්‍රඥප්තිය සහ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යන ප්‍රඥප්තීන් පිළියෙල කිරීම තුලින් අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල කාර්යභාරයන් වඩාත් ශක්තිමත් නෛතික රාමුවක් තුළ ඉටු කිරීමේ හැකියාව ලැබී ඇත.

### 3) ජාතික ඵලදායිතා සම්මාන ලබා ගැනීම

2014 සිට 2018 දක්වා ගතවූ කාලය තුළ දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජාතික ඵලදායිතා සම්මාන කිහිප වරක් ලබා ගැනීමට සමත් විය. 2015 වර්ෂයේදී පළාත් අමාත්‍යාංශ කාණ්ඩය යටතේ තරග කරමින් විශේෂ කුසලතා සම්මානයක්ද, 2016 වර්ෂයේදී පළාත් අමාත්‍යාංශ කාණ්ඩ යටතේ තරග කරමින් ජාතික ඵලදායිතා සම්මාන දෙවන ස්ථානය දිනා ගන්නා ලදී.

මේවන විට අමාත්‍යාංශය තුළ තත්ව කව 3ක් පවත්වා යන අතර එම කව 3ක් හරහා කව යෝජනා ක්‍රියාත්මක කරමින් අමාත්‍යාංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට පියවර ගැනීම

## 4) නිල වෙබ් අඩවිය හා මුහුණු පොත

2014 වර්ෂය වන විට අමාත්‍යාංශය සතුව නිල වෙබ් අඩවියක් නොතිබුනු අතර මාර්ගගත (Online) සේවාවක් පවත්වා ගෙන යාමට එය දැඩි බාධකයක්ව පැවතුණි. එබැවින් අමාත්‍යාංශය සඳහා නිල වෙබ් අඩවියක් නිර්මාණය කළ අතර ඒ හරහා අපගේ සේවාවන් පිළිබදව මහජනතාවට වඩාත් හොදින් දැනුවත් කිරීමටත් ජනතාවට අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබා දීමටත්, ඉලෙක්ට්‍රොනික ව්‍යාපාර නාම ලියාපදිංචිය වැනි මාර්ගගත (Online) සේවාවන් ලබා දීමටත් මේ වන විට හැකියාව ලැබී ඇත. එමෙන්ම දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු නිල වෙබ් අඩවිය රාජ්‍ය අංශවලට වෙබ් අඩවිය අතරින් ගත් කළ ග්‍රාහකයන් විශාල ප්‍රමාණයක් භාවිතා කරන වෙබ් අඩවියක් ලෙස හඳුන්වා දිය හැකිය.

අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට අමතරව අප විසින් සිදු කරනු ලබන ජනතා මෙහෙවර වඩාත් ප්‍රචලිත කරමින් ජනතාව අතරට ගෙන යෑමටත්, අමාත්‍යාංශයේ ප්‍රතිරූපය ඉහළ නැංවීමටත්, නිල මුහුණු පොතේ පිටුවක් යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ.

## 5) ඉලෙක්ට්‍රොනික ව්‍යාපාර නාම ලියාපදිංචිය කිරීම

දකුණු පළාතට අයත්වන වෙළෙඳ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ හා ඒ වෙනුවෙන් වන ආදායම රැස් කිරීමේ වගකීම හිමිව ඇති අමාත්‍යාංශය වශයෙන් එකී කටයුතු අඛණ්ඩව කරගෙන යනු ලබන අතර වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ව්‍යාපාරික ප්‍රජාව වෙත ලබාදීමේ අරමුණින් ඊ - ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ (e-Business Registration) සේවය මේ වන විටත් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ යටතේ දකුණු පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙළෙඳ අංශ පූර්ණ වශයෙන් ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ. තවද දකුණු පළාතේ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීමත්, දැනුවත් කිරීමත් හා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අගයන් එක් කරමින් දියුණු කිරීමටත් බලාපොරොත්තු වේ. එමෙන්ම ව්‍යාපාර වලට නීත්‍යානුකූල භාවයක් ලබා දීමටද මෙමගින් හැකියාව ලැබේ.

## 6) කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන හා පුහුණු ඒකකය (ADTU)

කෘෂි ව්‍යවසාය සංවර්ධන හා පුහුණු ඒකකය නමින් ව්‍යවසායක පුහුණු ඒකකයක් අරඹා ඒ හරහා ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන ලදි. එම ඒකකය කෘෂිකර්ම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරීන් 34 ගෙන් සමන්විත වන අතර ප්‍රථමයෙන් ඔවුන් සම්පත්දායකයන් වශයෙන් යොදා ගැනීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 02ක් පවත්වනු ලැබූ අතර, පුහුණු මාතෘකා සඳහා සම්පත්දායකයින් කණ්ඩායම්වලට බෙදා වෙන් කර ඇත. සෑම කණ්ඩායමකටම අදාල පුහුණු මොඩියුල හා ගොවි අත්පොත් සාදා ඇති අතර ඒකකයට අදාල තාක්ෂණික උපකරණ හා අනෙකුත් පුහුණු ආධාරක මිලදීගෙන ඇත. මෙම ඒකකය මගින් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ව්‍යවසායක පුහුණු රැසක් පවත්වා ඇත.

## 7) ''රුහුණු රස සරණිය'' ප්‍රදර්ශනය

සාම්ප්‍රදායික ආහාර පිළිබඳ ප්‍රජාවේ දැනුම හා අවබෝධය නංවාලීම, සාම්ප්‍රදායික ආහාර පරිභෝජන විධික්‍රම නව්‍ය ආකාරයට ප්‍රචලිත කිරීම, සාම්ප්‍රදායික ආහාර වට්ටෝරු පිළිබඳ දේශීය ඥාණය එක්රැස් කිරීම හා බෙදා හැරීම, අනාගත පරපුර වඩ වඩාත් දේශීය ආහාර පරිභෝජනයට හුරුකරවීමෙන් නිරෝගී පරපුරක් බවට පත් කරවීම යන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ අරමුණ ඇතිව දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ''රුහුණු රස සරණිය'' දේශීය ආහාර ප්‍රදර්ශනය වාර්ෂිකව අංගයක් ලෙස විචිත්‍රවත් අයුරින් පවත්වනු ලැබේ. 2016 වර්ෂයේ මුල් වරට පළාත් ප්‍රදර්ශනයක් ලෙස පැවැත්වූ මෙම ප්‍රදර්ශනය එතැන් සිට අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ඊට සමගාමීව බිම්මල් සැණකෙලියක්ද පවත්වන ලදී. පාසල් දරුවන්, නවෝත්පාදක ආහාර නිෂ්පාදකයින්, කෘෂිපාදක කර්මාන්තකරුවන්, ත්‍රිවිධ හමුදාව, විශ්ව විද්‍යාල, සෞඛ්‍ය අංශ, යන්ත්‍රසූත්‍ර නිර්මාණකරුවන්, පෞද්ගලික ව්‍යවසායකයින් රැසකගේ දායකත්වයෙන් මෙම ප්‍රදර්ශනය පැවැත්වේ.

## 8) ''සදිය පැතිකඩ'' දකුණු පළාත් ජල තොරතුරු සංග්‍රහය

දකුණු පළාත් සභාවේ වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ලෙස වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ලෙස අප සතු සමාජ වගකීම අර්ථවත් කරමින් නිර්මිත මෙම කාර්යය සංවර්ධන සැලසුම්කරණයේදී දකුණු පළාතේ පිහිටි වැව්, අමුණු, ගංගා, ඇළදොළ, වාරි ඇළ මාර්ග, දිය ඇළි, ජල බුබුලු ඇතුළු ජල ප්‍රභවයන්, ප්‍රජා ජල ව්‍යාපෘති හා ජල සම්පාදන ව්‍යාපෘතිවලට අදාළව තොරතුරු ඇතුළත් වේ. සදිය පැතිකඩ ග්‍රන්ථය මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා අධ්‍යයන කටයුතුවල නිරත වන්නන් හටත් පාසල් සිසුන්ටත්, ගොවි ජනතාව ඇතුළු සියලු පොදු ජනතාවන්ටත් අවශ්‍ය දත්ත එක් රැස් කල දත්ත පද්ධතියක් වේ.

## 9) පාලන වාර්තාව

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව සිදුකරනු ලබන කළමණාකරණ, පරිපාලන හා සංවර්ධන කටයුතු පිළිබඳ සියළු විස්තර ඇතුළත් කර පාලන වාර්තාව සම්පාදනය කරනු ලැබේ. වාර්ෂිකව සකස් කරනු ලබන පාලන වාර්තාව ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) දකුණු පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන්, අප අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු ඇතුළු මෙම තොරතුරු අවශ්‍ය වන අනෙකුත් ආයතන වලටද ලබා දෙයි

## 1) ISO තත්ත්ව සහතික ලබා ගැනීම



Certificate of Conformity

The Sri Lanka Standards Institution
certifies that the Quality Management System of

MINISTRY OF AGRICULTURE - SOUTHERN PROVINCE
4TH FLOOR, DHAKSHINAPAYA, LABUDUWA, GALLE
SRI LANKA

has been assessed and approved in accordance with
the requirements of ISO 9001: 2015/ SLS ISO 9001: 2015

Certificate No: QSC 08403
This certificate issued on 2018-07-15 is valid up to 2019-07-14
Date of first certification 2016-07-15

SCOPE OF CERTIFICATION

FACILITATING, GOVERNING, COORDINATING, IMPLEMENTING AND FORMATION OF POLICIES FOR THE ACTIVITIES RELATED TO ADMINISTRATION, DEVELOPMENT & FINANCIAL MANAGEMENT WITHIN THE MINISTRY AND THE DEPARTMENTS ATTACHED TO THE MINISTRY, FOR THE UPLIFTMENT OF THE LIVING CONDITION OF THE PEOPLE IN THE SOUTHERN PROVINCE.

This approval is subject to the continued satisfactory operation of the organization's Quality Management System.

DIRECTOR GENERAL

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka
www.slsi.lk

ISO 9001

**2018 වසරේදී මෙය ISO 9001:2015 තත්ත්වයට ගෙන ඒම.**

## 2) ජාතික ඵළදායිතා සම්මාන ලබා ගැනීම





NATIONAL PRODUCTIVITY AWARDS 2015

NPS Sri Lanka

This is to Certify that

*Ministry of Agriculture, Agrarian Development, Irrigation, Water Supply and Drainage, Food Supply and Distribution, Trade and Cooperative Development, Southern Province*

was awarded

*Special Commendation*

in the

*Inter Provincial Ministries*

at the

**National Productivity Awards 2015**

on

14th December 2016

conducted by the

**National Productivity Secretariat**

Ministry of Public Administration & Management

J.J. Rathnasiri
Secretary
Ministry of Public Administration & Management

J.M. Thilaka Jayasundara
Director
National Productivity Secretariat

**2015 වර්ෂයේ ඵලදායිතා සම්මාන**

## 3) නිල වෙබ් අඩවිය හා මුහුණු පොත

**http://agrimin.sp.gov.lk/**




**https://www.facebook.com/agriministrysp/**



# 4) ඉලෙක්ට්‍රොනික ව්‍යාපාර නාම ලියාපදිංචිය කිරීම (EBR)


Electronic Business Registration
Southern Province
User : sandunika hansani
Home Backlog Entry Logout
New BR Entry
By Business Name
Search
Reset

Business Registration Backlog : **Entry List**

| Entry A | Entry B | File No. | Business Name | Business Place | District | Ds Division | Br Date | Status |
|---|---|---|---|---|---|---|---|---|
| EDIT | EDIT | මා/8/1503 | අභිලාෂ ඩිසයිනර්ස් | "කලයාණි", දිගන,හක්මන. | Matara | Hakmana | 2004-07-05 | Open |
| EDIT | EDIT | මා/8/1504 | සෝසොනික් නිෂ්පාදන | බෙරුවලවත්ත,(කුලී නිවස ) | Matara | Hakmana | 2004-07-05 | Open |
| EDIT | EDIT | මා/8/1501 | කිරි නිෂ්පාදන | අක්මගේ වත්ත, ඇල්ලවෙල, හක්මන. | Matara | Hakmana | 2004-07-01 | Open |
| EDIT | EDIT | මා/8/1502 | එකමුතු ශ්‍රම බලකාය | පාඩගලරුප්ප, මුරතමුරය,හක්මන | Matara | Hakmana | 2004-07-01 | Open |
| EDIT | EDIT | මා/8/1505 | නිමුතු කන්ට්‍රක්ෂන් | 146/2,උස්සරේගොඩවත්ත,නරවැල්පිට/බටහිර,හක්මන. | Matara | Hakmana | 2004-07-07 | Open |
| EDIT | EDIT | මා/8/1506 | රුචිර නිෂ්පාදන | "රුචිර",මළපලාවත්ත,වේපතඉර/දකුණ,හක්මන. | Matara | Hakmana | 2004-07-07 | Open |
| EDIT | EDIT | මා/8/1507 | සුරම්‍ය ෂූ පැලස් | නො.44,මාර්කට් පාර,හක්මන. | Matara | Hakmana | 2004-07-14 | Open |
| EDIT | EDIT | මා/8/1508 | රාජ්විල ප්‍රෝඩක්ට් | "රාජ්විල",ලල්පෙ,හක්මන. | Matara | Hakmana | 2004-07-21 | Open |
| EDIT | EDIT | මා/8/1509 | නිව් වීරතුංග ටෙක්ස්ටයිල්ස් | මාර්කට්, හක්මන | Matara | Hakmana | 2004-07-21 | Open |
| EDIT | EDIT | මා/8/1510 | වී මෝල | නො.189,මහගෙදර,වේපතඉර/බටහිර,හක්මන. | Matara | Hakmana | 2004-07-27 | Open |
| EDIT | EDIT | මා/8/1511 | නවෝද්‍යා රසකැවිලි නිෂ්පාදකයෝ | කහටගහරුප්ප,කොහුලියද්ද,හක්මන. | Matara | Hakmana | 2004-07-29 | Open |
| EDIT | EDIT | මා/8/1483 | සිංහ ලී ඉරුම්හල | නො.1/130,පනන්වෙල නැගෙනහිර,මී ඇල්ල. | Matara | Hakmana | 2004-05-07 | Open |
| EDIT | EDIT | මා/8/1484 | මාලික | හිල්ලග වත්ත,කැඹිලියපල,හක්මන. | Matara | Hakmana | 2004-05-12 | Open |
| EDIT | EDIT | මා/8/1485 | රුහුණු පැණි | පොල්ගස්ලන්ද,නරවැල්පිට/නැගෙනහිර,හක්මන. | Matara | Hakmana | 2004-05-12 | Open |
| EDIT | EDIT | මා/8/1487 | ධනුෂ්ක හුණු නිෂ්පාදන | ඉත්තගලහේන,කෝංගල,හක්මන. | Matara | Hakmana | 2004-05-14 | Open |
| EDIT | EDIT | මා/8/1488 | උපුල් ගල්වල | දොළෙහේන,වේපතඉර/උතුර,හක්මන. | Matara | Hakmana | 2004-05-14 | Open |
| EDIT | EDIT | මා/8/1489 | තිළිණ | "තිළිණ"බඩබද්ද,මී ඇල්ල. | Matara | Hakmana | 2004-05-18 | Open |
| EDIT | EDIT | මා/8/1490 | නිමන් | අංක:19,මී ඇල්ල,හක්මන. | Matara | Hakmana | 2004-05-20 | Open |
| EDIT | EDIT | මා/8/1491 | ගීතාංජලී වෙළෙඳසල | අංක:6/8,පොදු වෙළඳපොල,හක්මන. | Matara | Hakmana | 2004-05-27 | Open |
| EDIT | EDIT | මා/8/1492 | දූෂ්මන්ත ගල්වල | දුනුගහමඩලවත්ත,වේපතඉර/උතුර,හක්මන. | Matara | Hakmana | 2004-06-15 | Open |

Start Next End

## 5) කෘෂි ව්‍යවසායකත්ව ඒකක පිහිටුවීම (ADTU)



ADTU

An Excellent Agropreneur Through Training



## 6) රුහුණු රස සරණිය ප්‍රදර්ශනය






## 7) ''සදිය පැතිකඩ'' දකුණු පළාත් ජල තොරතුරු සංග්‍රහය



## 8) වාර්ෂික පාලන වාර්තාව



## 5.3 මූල්‍ය සමාලෝචනය

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන යන අංශයන්හි පසුගිය වර්ෂ තුන තුලදී වියදම් දරන ලද ආකාරය පහත විස්තර කර ඇත.

| වැය විෂය විස්තරය | වියදම | | | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 |
| ව්‍යාපෘතිය 1 අමාත්‍ය කාර්යාලය | | | | |
| <u>පුනරාවර්තන</u> | | | | |
| වැටුප් හා වේතන | 3,468,174.00 | 4,087,911.00 | 4,526,522.00 | 1,430,007.00 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 574,883.00 | 686,999.00 | 781,674.00 | 267,203.00 |
| වෙනත් දීමනා | 3,208,426.00 | 2,689,979.00 | 2,285,125.00 | 3,601,872.00 |
| ගමන් වියදම්-දේශීය | 598,850.00 | 761,050.00 | 1,061,432.00 | 455,700.00 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 840.00 | 410,798.00 | 400,000.00 | 99,719.00 |
| ඉන්ධන | 2,358,440.00 | 2,366,990.00 | 2,468,960.00 | 702,168.00 |
| ආහාර හා නිම් ඇඳුම් | 20,000.00 | 20,000.00 | - | - |
| වෙනත් සැපයුම් | - | 61,250.00 | 74,680.00 | 27,670.00 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | 165.00 | 5,650.00 | - | - |
| වාහන නඩත්තු | 3,384,458.00 | 2,872,746.00 | 2,406,025.00 | 660,652.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | - | 31,373.00 | 168,874.00 | - |
| ගොඩනැගිලි නඩත්තු | - | 4,600.00 | - | - |
| තැපැල් හා සන්නිවේදන | 491,758.00 | 611,552.00 | 827,104.00 | 280,499.00 |

| | | | | |
|---|---|---|---|---|
| විදුලිය හා ජලය | - | 393,425.00 | - | - |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 1,687.00 | 181,159.00 | 196,333.00 | 2,368.00 |
| පාඩු හා කපා හැරීම් | - | 7,745.00 | - | - |
| අනපේක්ෂිත සේවා | 93,262.00 | 33,293.00 | 13,300.00 | 365.00 |
| <u>ප්‍රාග්ධන</u> | | | | |
| වාහන වැඩිදියුණු කිරීම් | 981,500.00 | - | - | - |
| **එකතුව** | **15,182,443.00** | **15,226,520.00** | **15,210,029.00** | **7,528,223.00** |
| **ව්‍යාපෘතිය 2 අමාත්‍ය කාර්යාලය** | | | | |
| <u>පුනරාවර්තන</u> | | | | |
| වැටුප් හා වේතන | 12,440,720.00 | 15,259,274.00 | 17,796,355.00 | 19,262,374.00 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,123,183.00 | 1,468,450.00 | 2,077,404.00 | 3,630,707.00 |
| වෙනත් දීමනා | 12,222,011.00 | 9,615,275.00 | 7,910,084.00 | 6,299,354.00 |
| ගමන් වියදම්-දේශීය | 972,141.00 | 859,584.00 | 1,272,385.00 | 2,467,824.00 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,172,762.00 | 1,099,700.00 | 1,496,209.00 | 934,698.00 |
| ඉන්ධන | 1,889,337.00 | 1,866,327.00 | 2,580,550.00 | 2,922,090.00 |
| ආහාර හා නිම් ඇඳුම් | 40,000.00 | 28,000.00 | - | - |
| වෙනත් සැපයුම් | 20,448.00 | 67,241.00 | 70,918.00 | 69,290.00 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | 6,230.00 | 40,705.00 | - | - |
| වාහන නඩත්තු | 1,595,954.00 | 1,581,523.00 | 1,842,821.00 | 3,053,754.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 18,155.00 | 35,365.00 | 149,769.00 | 4,600.00 |

| | | | | |
|---|---|---|---|---|
| නඩත්තු | | | | |
| ගොඩනැගිලි නඩත්තු | 41,920.00 | 7,050.00 | 20,400.00 | - |
| වෙනත් නඩත්තු | 2,450.00 | - | - | - |
| තැපැල් හා සන්නිවේදන | 768,160.00 | 935,177.00 | 787,681.00 | 1,022,517.00 |
| විදුලිය හා ජලය | 999,334.00 | 1,000,000.00 | 1,477,749.00 | 1,341,739.00 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 191,917.00 | 322,415.00 | 185,552.00 | 164,208.00 |
| ප්‍රදාන | 1,947,680.00 | - | - | - |
| රාජ්‍ය සේවකයින් සඳහා දේපල ණය | - | - | - | 417,268.00 |
| පාඩු හා කපා හැරීම් | - | - | 14,250.00 | 33,600.00 |
| අනපේක්ෂිත සේවා | 4,248,000.00 | 2,978,786.00 | 2,406,116.00 | 2,608,321.00 |
| **එකතුව** | **39,700,402.00** | **37,164,872.00** | **40,088,243.00** | **44,232,344.00** |
| **ප්‍රාග්ධන** | | | | |
| වාහන- වැඩිදියුණු කිරීම | - | - | | - |
| කෘෂිකර්ම සංවර්ධනය - උපමාන පාදක | 10,035,539.00 | 114,234,077.00 | 138,684,174.00 | 70,862,833.88 |
| වාරිමාර්ග සංවර්ධනය - උපමාන පාදක | 12,365,958.00 | 58,792,092.00 | 65,619,740.00 | 25,410,633.37 |
| සමුපකාර සංවර්ධනය - උපමාන පාදක | 3,497,135.00 | 5,944,262.00 | 6,896,302.00 | 4,033,000.00 |
| වෙළෙඳ කටයුතු සංවර්ධනය - උපමාන පාදක | 3,460,499.00 | 6,709,993.00 | 6,999,901.00 | 4,882,330.23 |
| ආහාර සැපයුම් හා බෙදාහැරීම් - උපමාන පාදක | 4,990,282.00 | 9,578,839.00 | 9,938,951.00 | 7,459,208.80 |

| | | | | |
|---|---|---|---|---|
| ජල සම්පාදන හා ජලාපවහන - උපමාන පාදක | 14,997,261.00 | 28,738,758.00 | 9,912,470.00 | 7,543,543.78 |
| කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය - උපමාන පාදක | - | 4,999,981.00 | - | - |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 5,150,382.00 | 609,135.00 | 2,320,103.00 | 225,550.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - | - | 3,420,488.00 |
| ගොඩනැගිලි හා ඉදි කිරීම් | - | - | 8,735,098.00 | 10,326,577.00 |
| මානව සම්පත් සංවර්ධනය | - | - | - | 57,500.00 |
| කෘෂිකර්ම සංවර්ධනය - පළාත් නිශ්චිත සංවර්ධන | 77,885,223.00 | 196,166,671.00 | 68,978,431.00 | 46,924,811.70 |
| කෘෂි මාර්ග සංවර්ධනය - පළාත් නිශ්චිත සංවර්ධන | 4,278,474.00 | - | - | - |
| වාරිමාර්ග සංවර්ධනය - පළාත් නිශ්චිත සංවර්ධන | 23799296 | 61,256,387.00 | 88,643,073.00 | 54,920,099.78 |
| සමූපකාර සංවර්ධනය - පළාත් නිශ්චිත සංවර්ධන | 2,000,000.00 | 2,985,806.00 | 1,971,199.00 | - |
| දකුණු පළාත් වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය | - | 2,225,128.00 | 9,191,954.00 | 184,450.00 |
| පර්යේෂණ හා සංවර්ධන | - | - | 942,600.00 | 320,224.00 |
| **එකතුව** | **162,460,049.00** | **492,241,129.00** | **418,833,996.00** | **237,423,850.34** |

## 5.4. මූල්‍ය පුරෝකථන

2020 සිට 2024 දක්වා ඉදිරි පස් වර්ෂයක කාල සීමාවේදී ඉහතින් විස්තර කළ අමාත්‍යාංශයේ සියළු අංශයන් හරහා ( ආයතන, සංවර්ධන, ගිණුම්, ජල සම්පාදන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ හා කෘෂිපාදක කර්මාන්ත) දියත් කිරීමට සැලසුම්කොට ඇති සියළු වැඩසටහන්හි සවිස්තරාත්මක මූල්‍ය පුරෝකථන වාර්තා ඇමිණුම් මගින් දක්වා ඇති අතර, එක් එක් අංශයන් සඳහා වැය කිරීමට අපේක්ෂිත සමස්ථ ඇස්තමේන්තු අවශ්‍යතාවය සාරාංශගතකොට පහත දක්වා ඇත.

| අංශය | මූල්‍ය පුරෝකථන (රු.මි) | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ජල සම්පාදන හා ජලාපවහන අංශය | 54.55 | 64.35 | 55.86 | 61.86 | 55.96 |
| ආහාර සැපයුම් අංශය | 16.8 | 14.25 | 16.70 | 18.15 | 20.85 |
| වෙළෙඳ අංශය | 23.2 | 23.0 | 27.9 | 31.5 | 39.9 |
| කෘෂිපාදක අංශය | 11.595 | 11.595 | 11.695 | 11.695 | 11.995 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 11.0 | 8.0 | 13.0 | 9.0 | 10.0 |




# පරිච්ඡේදය - 06
# ශද්‍රඅත විශ්ලේෂණය
# SWOT ANALYSIS

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2020-2025 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේදී පොදුවේ අමාත්‍යාංශය සඳහා මෙන්ම අමත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන අංශයන් සඳහාද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශයන් සඳහාද වෙන වෙනම SWOT විශ්ලේෂණයන් සිදුකර ආයතනය/ අංශය සතු ශක්තීන්, දුර්වලතා මෙන්ම මුහුණදීමට සිදුවන තර්ජන හා භාවිතා කළ හැකි අවස්ථාවන් කවරේද යන්න හඳුනා ගැනීම සිදුකරන ලදී.

## 1) ශක්තීන්

1. ශක්තිමත් නායකත්වයක් පැවතීම
2. දැනුම කුසලතා හා ආකල්ප අතින් පරිපූර්ණ කාර්යමණ්ඩලයක් පැවතීම.
3. දේශිය විදේශිය පුහුණු අත්දැකීම්
4. සිත්ගන්නා සුළු වැඩපරිසරයක් පැවතීම.
5. අවශ්‍යකරන යටිතල පහසුකම් හා කාර්යාලයීය උපකරණවල හිඟයක් නොවීම
6. රාජකාරී කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ භාවිතයන් ඉහළ මට්ටමක පැවතීම
7. අමාත්‍යාංශයට අදාළ විෂයන් සඳහා දත්ත පද්ධති පවත්වාගෙන යාම
8. කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන හා පුහුණු ඒකකය (ADTU) ස්ථාපිත කර තිබීම
9. දකුණු පළාතට ආදායම් උත්පාදනය කරන ගොවිපල හා අලෙවි සැල් ජාලයක් තිබීම ( රුහුණු රසාර)
10. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය
11. රුහුණු රස සරණිය ප්‍රදර්ශනය

## 2) දුර්වලතා

1. සියළුම ව්‍යාපෘති පසු විපරම් කිරීම සඳහා නිර්ණායක පදනම් කරගත් නිශ්චිත ඇගයීම් ක්‍රමවේදයක් නොමැතිවීම. (ඇතැම් ව්‍යාපෘති සඳහා පමණක් දැනට මෙය ක්‍රියාත්මක වේ)
2. නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වලදී කාලය කළමණාකරණය කර ගැනීමේ දුර්වලතා
3. ඇතැම් කරුණු සම්බන්ධව නිලධාරීන්ගේ විෂයානුබද්ධ දැනුම ප්‍රමාණවත් නොවීම
4. ප්‍රතිලාභීන් වෙත 50% තාක්ෂණික උපකරණ ලබාදීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයක් යාවත්කාලීන නොවීම.
5. නිලධාරීන් සඳහා ලබාදෙන විෂයානුබද්ධ පුහුණු ප්‍රමාණවත් නොවීම
6. නිලධාරීන් රාජකාරිය සඳහා අභිප්‍රේරණය කිරීමට

## 3) අවස්ථා

1. දකුණු පළාතේ ජනගහනයෙන් 30% කට වැඩි පිරිසක් කෘෂිකාර්මික පදනමක් සහිත ජීවනෝපායන්හි නිරතවීම
2. වස විසෙන් තොර ප්‍රමිතිගත කාබනික ආහාර නිෂ්පාදන සඳහා සමාජයේ අධික ඉල්ලුමක් පැවතීම
3. පළාත තුළ කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු ඉඩම් ප්‍රමාණවත් ලෙස පිහිටා තිබීම.
4. දකුණු පළාතේ ඕනෑම වගාවකට සුදුසු අයුරින් විවිධ දේශගුණික තත්වයන් හා විෂමතාවයන් පැවතීම.
5. ජාතික ප්‍රතිපත්තීන්හි අනුකූලතාවය (ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වැනි ජාතික වැඩසටහන් පැවතීම)
6. ප්‍රාථමික හා අගය එකතු කළ කෘෂි නිෂ්පාදන සඳහා පළාත තුලට හොඳ වෙළෙඳපොලක් පැවතීම.
7. දකුණු පළාත තුළ කෘෂි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය වීම.

## 4) තර්ජන

1. තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් ඈත්වීම
2. කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම අඩු මට්ටමක පැවතීම
3. ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාද වීම හා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම
4. දේශගුණික විපර්යාස හා ස්වාභාවික විපත්

දකුණු පළාත් කෘෂිකර්ම ගොවිජන සංවර්ධන ..... අමාත්‍යාංශය යටතේ වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ කෘෂිපාදක කර්මාන්ත සංවර්ධනය යන අංශයන් සඳහා ද SWOT විශ්ලේෂණය වෙන වෙනම සිදුකළ අතර, **ඇමුණුම 05** මගින් ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දක්වා ඇත.



# පරිච්ඡේදය 07
# ක්‍රියාත්මක ක්‍රමවේදය
# ARRANGEMENT FOR IMPLEMENTATION

උපාය මාර්ගික සැලසුමක් පිළියෙළ කිරීමේදී එම සකස් කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවද සැලසුම් කිරීම උපාය මාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියේ වැදගත්ම පියවරකි.මෙමඟින් ආයතනයේ සිටින මානව සම්පත්, මූල්‍ය සම්පත්, අනෙකුත් භෞතික සම්පත් සහ තාක්ෂණික සම්පත් මනා ලෙස කළමනාකරණය කරමින් ආයතනයේ දැක්ම හා අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩා පහසුවනු ඇත. 2020-2024 සඳහා සකස් කරනු ලබන පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මට අදාළව සකස් කරන ලද සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් **ඇමිණුම 06** මගින් දක්වා ඇති අතර, එම සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත ක්‍රමවේදය පහතින් දක්වා ඇත. දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පස් අවුරුදු උපායමාර්ගික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී එක් එක් විෂයයන්ට අදාළ පාර්ශ්වකරුවන් කැඳවා එම ක්ෂේත්‍රයට අදාළ ගැටළු, විසඳුම් හා උපායමාර්ග හඳුනා ගැනීමට කටයුතු කළෙමු. එසේ හඳුනාගන්නා ලද ගැටළු සහ විසඳුම් පිළිබඳ විස්තර **ඇමිණුම 07** මගින් ඉදිරිපත් කරන අතර, පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා සහභාගී වූවන්ගේ නාම ලේඛනය **ඇමිණුම 11** මගින් අමුණා ඇත.

## 7.1 සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම (Who implement the plan?)

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය ගත් කළ ප්‍රධාන වශයෙන් එය මට්ටම් 03 කින් යුක්ත වේ.

1. **අමාත්‍යාංශ ලේකම් -**
   ආයතනයේ උපායමාර්ගික තීරණ ගැනීමේ බලතල සෘජුවම පැවරෙණුයේ අමාත්‍යාංශ ලේකම් වෙතටය. දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉදිරි පස් වසර අවසානයේදී ළඟා විය ඇති ස්ථානය පිළිබඳව පැහැදිලි දැක්මක් හා අවබෝධයක් අමාත්‍යාංශ ලේකම් සතුව පවතින අතර තම දෙවන පෙළ කළමනාකාරිත්වය සහ යටත් නිළධාරීන් දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නිරන්තරයෙන්ම මෙහෙයවීම ඔහුගේ කාර්යභාරය වේ.

2. **දෙවන පෙළ කළමණාකරුවන් -**
   දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආයතන, සංවර්ධන සහ ගිණුම් ලෙස අංශ 03කින් සමන්විත වන අතර දෙවන පෙළ කළමනාකරුවන් විසින් එම අංශය තුළ රාජකාරි සිදුකරන නිළධාරීන් මෙහෙයවීම සිදු කරනු ලැබේ. උපාය මාර්ගික සංවර්ධන සැලැස්මට අනුව එක් එක් නිළධාරියා වෙත පවරන ලද වගකීම් කොටස මනා ලෙස ඉටුවන්නේද යන්න පිළිබඳව දෙවන පෙළ කලමනාකාරිත්වය වගවිය යුතු අතර තම අංශයේ ක්‍රියාවලින්ගේ ප්‍රගතිය පිළිබඳව නිරන්තරයෙන් අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කිරීම ඔවුන්ගේ වගකීම වේ.

3. **තෙවන පෙළ නිලධාරීන්**
   කාර්ය මණ්ඩලයේ තෙවන පෙළ නිලධාරීන්ගේ වගකීම වනුයේ, තම රාජකාරී ලැයිස්තුව මගින් තමා වෙත පවරා ඇති කාර්යභාරය නිශ්චිත කාල සීමාව තුලදී ප්‍රමාදයකින් තොරව ඉටු කිරීම, මෙම කාර්යභාරය ඉටු කිරීමේදී ඇතැම් අවස්ථාවල ගැටළුකාරී තත්වයන් මතුවන්නේ නම් ආයතන ප්‍රධානියා හා දෙවන පෙළ කළමණාකාරීත්වය වෙතින් උපදෙස් ලබා ගෙන එම කාර්යයට අදාළ නිශ්චිත කාර්ය සාධන ඉලක්ක වෙත ළඟා වීමයි.

## 7.2 අප කළ යුත්තේ කුමක් ද? (What must be done?)

**1) නිළධාරින් දැනුවත් කිරිම. (Awareness Programmes)**

2020-2024 සඳහා සකස් කරනු ලබන උපායමාර්ගික සැලැස්ම පිළිබඳව ඉතා විස්තරාත්මකව ආයතනයේ ඉහළ පෙළ කළමනාකාරිත්වයේ සිට පහළම සේවකයා දක්වාම මනා අවබෝධයක් ලබා තිබීම එය ක්‍රියාවට නැංවීම සඳහා පහසුවක් වනු ඇත.එබැවින් සකස් කරනු ලබන උපායමාර්ගික සැලැස්මට අදාළව ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු, පරමාර්ථ අරමුණ ළඟා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපායමාර්ග, ව්‍යාපෘතීන්, කාර්ය සාධක දර්ශක ආදිය ඇතුළත් විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියලුම නිළධාරින් දැනුවත් කිරිම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කරනු ලැබේ.එසේ දැනුවත් කිරීමෙන් පසුව උපායමාර්ගික සැලසුමට අනුගතව ආයතනයේ සියළුම සේවකයන්ට විධිමත් පරිදි රාජකාරි පවරනු ලැබේ. මේ යටතේ සියළුම මාණ්ඩලික, මාණ්ඩලික නොවන නිළධාරින් හා කනිෂ්ඨ සේවකයින් සඳහා විධිමත් පරිදි රැකියා විස්තර සහ රාජකාරී ලැයිස්තු ලබා දීම තුළින් නිෂ්චිත ඉලක්ක හා වගකීම් ලබා දීමට අපේක්ෂිතය. ආයතනයේ ඉහළ පෙළ කළමනාකාරිත්වය විසින් එම එක් එක් නිළධාරින්ට ලබා දී ඇති රාජකාරි මනා ලෙස ඉටු කරන්නේද යන්නත් නියමිත කාර්යසාධක දර්ශක වෙත ඔවුන් නියමිත පරිදි ළඟා වන්නේද යන්නත් අධීක්ෂණය කිරීම කළ යුතුය.

**2) ධාරිතා සංවර්ධනය ( Capacity Building)**

අලුතින් සකස් කරනු ලබන උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරිම සඳහා සියළුම නිළධාරින් තුළ තිබිය යුතු තාක්ෂණික දැනුම හැකියාව සහ ආකල්ප හඳුනා ගැනීම සිදු කළ යුතුය.එසේ හඳුනාගත් අවශ්‍යතා සඳහා වෙන වෙනම කළමනාකරණය පිළිබඳ පුහුණු, තාක්ෂණික පුහුණුවීම් හා ආකල්පමය සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ඇතුළු පුහුණු වැඩසටහන් ඇතුළු පුහුණුවීම් සංවිධානය කිරිමට අපේක්ෂිතය.

**3) අභිප්‍රේරණ වැඩසටහන් ( Motivation )**

නිළධාරින්ගේ අභිප්‍රේරණය ඇති කිරීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කරනු අතර මේ සඳහා ජාතික මට්ටමේ ප්‍රසිද්ධියක් උසුලන විශේෂඥයින් සම්පත් දායකයින් ලෙස තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ. නිළධාරින් තුළ අන්‍යොන්‍ය සුහදතාවය, කණ්ඩායම් හැඟීම, විශ්වාසය වැනි ගුණාංග වැඩි දියුණු කරමින් නිළධාරින් අභිප්‍රේරණය සඳහා බැහැරගත පුහුණු වැඩසටහන් (OBT) සංවිධානය කිරීම හා තම කාර්ය සාධක ඉලක්ක නියමිත පරිදි ළඟා කරගන්නා නිළධාරින් තෝරා ඔවුන්ට විදේශ පුහුණු අවස්ථා ලබා දිම සිදු කෙරේ. අමාත්‍යාංශ නිලධාරීන්ගේ සුභ සාධනය උදෙසා අමාත්‍යාංශ සුභසාධක සංගමය විසින් ද විවිධ ක්‍රියාකාරකම් හා දීමනා ගෙවීම් සිදුකෙරේ.

මීට අමතරව දක්ෂ නිළධාරින් ඇගයීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම මෙන්ම නියමිත කාර්යසාධන මට්ටමට වඩා අඩු කාර්ය සාධන මට්ටමක්

පෙන්නුම් කරන නිළධාරීන් සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. දඬුවම් ක්‍රමවේද භාවිතා කිරීමද සිදු කරනු ලැබේ.

**4) ක්‍රියාවලි කාර්යක්ෂමතාවය ඉහල නැංවීම (Process Efficiency Development)**

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය පරිපාලනමය වශයෙන් අංශ 03 කට වෙන්කර ඇති අතර ඒ සෑම අංශයකටම වෙන වෙනම එලදායිතා කව මගින් එලදායිතා සංකල්පය ක්‍රියාක්මක කෙරේ. මෙම තත්ව පාලන කව සඳහා ඒ ඒ අංශවල ඉහළ සිට පහළ දක්වා සියළුම නිලධාරීන් සහභාගි වන අතර,ඔවුහු තම සේවාවන් හා ක්‍රියාවලි මේ හරහා නිරන්තරයෙන් වැඩිදියුණු කරති. ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට හා සරල කිරීමට තොරතුරු තාක්ෂණ භාවිතය යොදා ගැනීම ද මෙහි දී සිදු කෙරේ.

**5) ප්‍රතිපෝෂණය හා නිවැරදි කිරීම. (Feedback and Correction)**

පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ දී මතුවන ගැටළු, අවශ්‍යතා, දුක්ගැනවිලි සහ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වරින්වර ප්‍රතිපෝෂණ රැස්වීම සිදුකෙරේ. මෙවැනි රැස්වීම් වලදී ඉදිරිපත් වන ගැටළු සඳහා විසඳුම් යෙදීම තුලිනුත්, අවශ්‍යතා සම්පූර්ණ කර දීම තුලිනුත් , අමාත්‍යාංශයේ සේවාවන් වැඩිදියුණු කිරීම සිදුකෙරේ. උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට අදාල ක්‍රියාකාරි සැලැසුම් ක්‍රියාත්මත කිරීමේ දී අමාත්‍යාංශය කාර්යමණ්ඩලයේ සහභාගිත්වය ලබාගැනීම ද සිදු කෙරේ.

**6) ඇගයීම (Evaluation)**

මෙහි දී එක් එක් නිලධාරීයා වෙත ලබාදුන් කාර්යයන් ඇගයීම පෞද්ගලික මට්ටමින් සිදු කරන අතර,වාර්ෂික කාර්යසාධන ඇගයීම් ආකෘතින් ඒ සඳහා භාවිතා කෙරේ. එමෙන්ම අවසාන වශයෙන් එක් එක් නිළධාරින්ගේ කාර්යභාරය මගින් සිදු වූ බලපෑම හා ප්‍රතිදානය (outcome and impact) නිෂ්චිත කාර්ය සාධක දර්ශක යොදාගෙන ඇගයීමට කටයුතු කරනු ලැබේ.

## 7.3 අභියෝගයන්

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ඉදිරි පස් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන මෙම උපායමාර්ගික සැලැස්ම තත්කාලීනව ක්‍රියාත්මක කරගෙන යාමේදී ඇතැම් අවස්ථාවලදී ගැටළු සහ අභියෝගවලටද මුහුණ දීමට සිදුවීම බොහෝ සෙයින් අපේක්ෂා කළ හැකි කාරණයකි. සැබැවින්ම මීට පෙර 2015-2019 පස් වසර සඳහා සකස් කරන ලද උපායමාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීමේදීද විවිධ අභියෝගවලට මුහුණදුන් අතර, එහිදී ලබාගත් අත්දැකීම් ආශ්‍රයෙන් පහත සඳහන් ගැටළු, එල්ලවිය හැකි අභියෝගයන් ලෙස හඳුනා ගන්නා ලදී.

1) දේශපාලනික බලපෑම

සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී, ඒවා ක්‍රියාවට නැංවීමේදී මෙන්ම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදීත් මෙම බලපෑම් ඇතිවිය හැකි අතර, මෙය ධනාත්මක හා සෘණාත්මක යන දෙයාකාරයෙන්ම බලපෑම් ඇතිකරයි.

2) සීමිත ප්‍රතිපාදන

උපාය මාර්ගික සැලසුම්කරණයේදී ඇස්තමේන්තුගත කරන ලද ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම නොලැබී යාම තවත් අභියෝගයකි. මේ නිසා ඇතැම් විට යෝජිත ව්‍යාපෘතින්හි අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීයාමත්, ඇතැම් ව්‍යාපෘතින්හි අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීයාමත්, ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමත් සිදුවිය හැක.

3) මානව සම්පත් හිඟකම

ඇතැම් අවස්ථාවලදී ඇතැම් ව්‍යාපෘති සඳහා කිසියම් සුවිශේෂී ප්‍රාගුණ්‍යයක් සහිත මානව සම්පත්වල අවශ්‍යතාවය මතුවේ. එවැනි අවස්ථාවලදී මානව සම්පත් හිඟතාවයක් මතුවීම අභියෝගකාරී වේ.

4) දුර්වල සම්බන්ධීකරණය

උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී එම කාර්යයන් අතර මනා සම්බන්ධීකරණයක් තිබීම එම සැලසුම් නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ඉතා වැදගත් වේ. නොඑසේනම් සත්‍ය වශයෙන්ම ආයතනයේ අපේක්ෂිත ඉලක්ක හා පරමාර්ථ වෙත ළඟාවීම අභියෝගාත්මක වනු ඇත.

5) නියමිත කාලසීමාව ඉක්මවීම්/ ප්‍රමාද වීම්

උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම, සැලසුම් කරන ලද කාල සීමාව තුළ සිදු කිරීම, ආයතනයේ අරමුණු, ඉලක්ක වෙත ළඟා වීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපාන සාධකයකි. ඇතැම් අවස්ථාවලදී ආයතනයේ අභ්‍යන්තර ගැටළුකාරී තත්වයන් හෝ බාහිර සාධක හේතුවෙන් නිශ්චිත කාල සීමාවන් ඉක්මවා යාමද අභියෝගාත්මක කාරණයකි.



# පරිච්ඡේදය - 08
# උපාය මාර්ගික ප්‍රගති සමාලෝචන, ඇගයීම හා පාලනය
# STRATEGIC REVIEW, EVALUATION & CONTROL

## 8.1. නිගමන ක්‍රමවේදය

කිසියම් ආයතනයක් සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීම, එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙන්ම, එම සැලැස්ම නියමිත පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා යම් ක්‍රමානුකූල වැඩපිළිවෙලක් තිබීම ඉතා වැදගත් වේ. මෙම පරිච්ඡේදය තුලින් විස්තර කරනුයේ 2020-2024 පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මෙහි ප්‍රගතිය නියාමනය හා ඇගයීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදය පිළිබඳවයි. නිශ්චිත උපායමාර්ගික සැලසුම් ප්‍රගති සමාලෝචන හා ඇගයීම් ක්‍රමවේදයක් පැවතීම මගින් ආයතනයේ පරමාර්ථ හා අරමුණු කරා ළඟාවීම පහසු කරයි. මෙහිදී මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචන ක්‍රමවේදය එක් එක් අංශයන්හි කාර්යසාධන දත්තයන් සහ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මත පදනම් වී ඇත.

බොහෝ විට ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රගතිය යම් නිශ්චිත කාල පරාසයන් තුලදී දිගින් දිගටම නියාමනය කිරීම ඉතා වැදගත් වේ. මෙම කර්තව්‍ය ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී හෝ වෙනත් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය මත සිදුකළ යුතුවේ. විගණන කමිටුවක් මගින්ද මෙම කටයුතු අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ. මෙම කමිටුව මගින් ආයතනයේ කාර්යසාධනය ඇගයීමට ලක් කිරීම මෙන්ම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග තුලින් සැලැස්මේ කාර්යසාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. කාර්යසාධන ඇගයීමේදී කලින් විනිශ්චය කරන ලද කාර්ය සාධක දර්ශක, ප්‍රතිදානය හා ප්‍රතිඵල පිළිබඳ සැලකිලිමත් විය යුතුවේ. මෙහිදී අපේක්ෂිත ප්‍රතිඵලවල (Outcome) යම් පසුබෑමක් සිදුවී ඇත්නම් ඒ පිළිබඳව අවශ්‍ය කරන උපදෙස් හා මාර්ගෝපදේශ ලබාදීම තුලින් එම ගැටළුකාරී තත්වයන් මඟ හැර ගැනීම අපේක්ෂා කෙරේ.

## 8.2. මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචනය

### 1) ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙහෙයවීම සහ ඇගයීම සඳහා ව්‍යාපෘති මෙහෙයවීම් සහ ඇගයීම් ඒකකය (PMEU) අමාත්‍යාංශයේ සංවර්ධන අංශය තුළ පිහිටවනු ලැබේ. මෙය ආයතන ප්‍රධානියා මාණ්ඩලික නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්ගෙන් සැදුම්ලත් ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම ඒකකය මගින් ප්‍රගති වාර්තා පරීක්ෂා කිරිම, ස්ථානීය පරීක්ෂාව, ප්‍රගති සමාලෝචන රැස්වීම් වැනි විවිධ ක්‍රමවේද මගින් ප්‍රගතිය ඇගයීම සිදුකරනු ලැබේ. ( **ඇමිණුම 08** ව්‍යාපෘති කේෂ්ත්‍ර පරීක්ෂා කිරීම් වලදී තොරතුරු ලබා ගන්නා ආකෘති පත්‍රයක් )

### 2) ප්‍රමාණාත්මකව විශ්ලේෂණ මෙවලම්

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සහ මේ යටතේ පවතින දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වන සියළුම ව්‍යාපෘති ඇගයීම සඳහා එක් එක් ව්‍යාපෘතියට වෙන් වෙන් වශයෙන් නිර්ණායක හඳුනා ගැනීම සිදු කරනු ලැබේ. එම නිර්ණායක පදනම් කරගෙන ව්‍යාපෘතිවල සාර්ථකත්වය පිළිබඳව ප්‍රමාණාත්මකව විශ්ලේෂණයක් සිදුකළ හැකිය. එම විශ්ලේෂණයන් කරනු

ලබන තොරතුරු මත ව්‍යාපෘතිවල ඵලදායිතාවය අනුව ඒවා වෙනස් කිරීම, වැඩිදියුණු කිරීම හෝ ඵලදායි නොවන ව්‍යාපෘති නතර කිරීම සිදු කළ හැකිය.

**3) ප්‍රගති සමාලෝචන රැස්වීම් පද්ධතිය**

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සියල්ලම යම් නිශ්චිත කාල සීමාවකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා තම ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කටයුතු ඇතුළු අනෙකුත් සියළුම කාර්යය භාරයන්හි ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය කිරීමක් සිදු කෙරේ.

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් කාර්යාල හා කලාප කාර්යාලවල ප්‍රධානීන් සමග සති 6කට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වනු ලැබේ. එමෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මසකට වරක්ද, දිස්ත්‍රික් ප්‍රධානීන් විසින් සති 2කට වරක් ද, කලාප භාරව කටයුතු කරන ප්‍රධානීන් විසින් සති 2කට වරක් ද වශයෙන් මෙම රැස්වීම් පවත්වනු ලැබේ. මෙහිදී එක් එක් නිශ්චිත කාරණා සම්බන්ධයෙන් පසුගිය රැස්වීමට සාපේක්ෂව අදාළ කාල සීමාව තුල ලගා කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව සොයා බැලීම සිදුකරන අතර, ගැටළුකාරී අවස්ථාවන්හිදී ඒ සම්බන්ධ උපදෙස් ලබාදීම හා නියෝග කිරීම සිදු කෙරේ. ( **ඇමිණුම 09** 2019-08-06 දින පැවති කෘෂිකර්ම ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාව )

**4) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පසු විපරම් කිරීම.**

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී, අමාත්‍යාංශ විෂයයන්ට වෙන වෙනම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අතර, වර්ණ සංඥා භාවිතා කරමින්, එහි ප්‍රගතිය මාසිකව තෙවන සතියේ මාණ්ඩලික නිලධාරී රැස්වීමේදී සාකච්ඡාවට බඳුන් වේ. එහිදී එක් එක් විෂයයන් විසින් මාසිකව අපේක්ෂිත ප්‍රගතිය ළඟා කරගෙන නොමැතිනම්, එයට හේතුව විමසමින් ඒ සම්බන්ධ උපදෙස් ලබාදීම හා නියෝග කිරීම සිදු කෙරේ. ක්‍රියාකාරී සැලැස්මේ වර්ණ සංඥා භාවිතා කරමින් මාසික ප්‍රගතිය නිරීක්ෂණය කිරීම තුලින් ව්‍යාපෘතිවල පවතින ගැටළුකාරී තත්වයන් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සිදුකෙරේ. ( **ඇමිණුම 10** ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචන ආකෘතිය )

# ඇමුණුම්

## දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යූහය ඇමුණුම 01



## දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය තනතුරු අනුව කාර්ය මණ්ඩලය
## ඇමුණුම 02

| අනු අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ලේකම් | 1 | 1 | - |
| 2 | සහකාර ලේකම් | 2 | 2 | - |
| 3 | ගණකාධිකාරී | 1 | 1 | - |
| 4 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 2 | 2 | - |
| 5 | පරිපාලන නිලධාරි | 1 | 1 | - |
| 6 | සංවර්ධන නිලධාරි | 21 | 17 | 4 |
| 7 | තාක්ෂණ සේවා නිලධාරී | - | 1 | - |
| 8 | කළමනාකරණ සහකාර | 19 | 19 | - |
| 9 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | - | 1 | - |
| 10 | රියදුරු | 5 | 5 | - |
| 11 | කා.කා.ස | 5 | 4 | 1 |
| | **එකතුව** | **57** | **54** | **5** |

**දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා යෝජිත සංවිධාන ව්‍යුහය**

**ඇමුණුම 03**



## බාහිර පාරිසරික සාධක විශ්ලේෂණය (PESTEL) ඇමුණුම 04

### ජල සම්පාදන හා ජලාපවහන අංශය

**දේශපාලනික**

1. යහපත් දේශපාලනික පසුබිමක් තිබීම.
2. මහජනතාවගේ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර ඇත.

**ආර්ථික**

1. අධික සම්බන්ධතා ගාස්තු ගෙවීමට සිදුවීම.
2. අධික මාර්ග හානි හා යථා තත්වයට පත් කිරීමේ ගාස්තු ගෙවීමට සිදුවීම

**සමාජයීය**

1. පානීය ජල භාවිතය පිළිබඳ ජනතාව තුළ පවතින අඩු දැනුවත්භාවය.
2. පානීය ජල පවිත්‍රතාවය පිළිබඳ ජනතාව දක්වන අඩු සැලකිල්ල.

**තාක්ෂණික**

1. අවශ්‍ය තාක්ෂණික සහය සැමවිටම බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගැනීමට සිදුවීම.

**පාරිසරික**

1. ජල දූෂණයවීම.
2. ජලපෝෂක පෙදෙස් තර්ජනයට ලක්වීම.
3. ලවණ ජලය පානීය ජලය සමඟ මිශ්‍රවීම.

**නිතිමය**

1. නිශ්චිත නීතිමය රාමුවක් නොමැතිවීම.
2. නිශ්චිත භූගෝලීය සීමාවක් නොමැති නිසා වෙනත් ව්‍යාපෘති සමග ගැටුම් ඇතිවීම.

## ආහාර සැපයුම් හා බෙදාහැරීම් අංශය

**දේශපාලන**

1. විවිධ කෘෂි කාර්මික ජාතික වැඩසටහන් නිසා සුළු ව්‍යවසායන් දිරිමත්වීම (Enterprises Sri Lanka).
2. යහපත් දේශපාලනික මග පෙන්වීමක් තිබීම.

**ආර්ථික**

1. ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත්වීම නිසා ගොවීන්ගේ ආදායම ඉහළයාම.
2. කෘෂිපාදක කර්මාන්ත බිහිවීම.
3. මහා පරිමාන තරගකාරී ආයතන සමග තරග කිරීමට සිදු වීම.
4. ගොවිපල සංවර්ධනය තුළින් පළාත් සභාවේ ආදායම් වර්ධනය වීම.
5. කාබනික නිෂ්පාදන සඳහා ඉහළ මිලක් පැවතීම.

**සමාජයීය**

1. ප්‍රමිතිගත ආහාර පිළිබඳ ජනතාව තුළ පවතින නොදැනුවත්බව.
2. ආහාර සඳහා අධික රසකාරක හා රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා බෝ නොවන රෝග බහුල වීම.

**තාක්ෂණික**

1. අධි තාක්ෂණික ශක්‍යතාවයෙන් යුත් භාවිතයන් අවම වීම. ( ශීතාගාර / ගබඩාපහසුකම් ආදී)
2. පළාත් තුළ ආහාර නිෂ්පාදන හා බෙදාහැරීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට උසස් මට්ටමේ සන්නිවේදන තාක්ෂණ විධි භාවිතා නොකිරීම.
3. පළාත්බද නිෂ්පාදන බෙදාහැරීමට හා ඇසුරුම් කිරීමට නිශ්චිත තාක්ෂණයක් භාවිතා නොවීම.
4. අගය එකතු කළ නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ අඩු දැනුම.

**පාරිසරික**

1. ගොවිපල වැනි ස්ථානවල පවතින සීමිත ඉඩකඩ නිසා ඉහළ පාරිසරික ප්‍රමිතීන් පවත්වා ගත නොහැකි වීම.
2. වෙනස් වන දේශගුණික තත්වයන් හා පාරිසරික ආපදා .
3. පාරිසරිකව දූෂ්‍ය ස්ථාන වල විවෘතව ආහාර නිෂ්පාදන අලෙවි සැල් පිහිටුවා තිබීම.
4. ස්වාභාවික ගෙවතු හා වනාන්තර ආශ්‍රිත පලතුරු නිෂ්පාදනයට හා බෙදාහැරීම් ජාලයට එක් නොවීම.

**නිතිමය**

1. ආහාරවල ප්‍රමිතිය සම්බන්ධව කටයුතු කිරිමේදී නීතිමය බලයක් නොමැතිවිම.
2. පවතින නිතිරීති වල ඇති අඩුපාඩු.

## වෙළෙඳ අංශය

**දේශපාලනික**

1. දේශපාලනික වශයෙන් උපරිම සහයෝගයක් ලැබීම.
2. පනත්, ප්‍රඥප්ති අනුමත කිරීම තුලින් බලය ලබා දීම.
3. රටේ ජාතික ප්‍රතිපත්තියට ඉදිරියෙන් සිට කටයුතු කිරීමට හැකිවීම.

**ආර්ථික**

1. අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා ගැනීම සඳහා වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
2. දකුණු පළාතේ මුදල් ප්‍රභවයක් වීම.
3. බදු ආදායම් සඳහා මහ විවර වීම.
4. දකුණු පළාත තුල නිෂ්පාදනය ඉහල යාම.

**සමාජීය**

1. ව්‍යාපාරයට නෛතික හා සුරක්ෂිතභාවයක් ලැබීම.
2. ග්‍රාමීය වශයෙන් මේ පිළිබඳව දැනුවත්භාවය අඩුකම.
3. අවිධිමත් ව්‍යාපාර/නීති විරෝධී ව්‍යාපාර සඳහා ඇති ඉඩ ප්‍රස්ථා ඇහිරීම.
4. පවුල් ඒකකවල ආර්ථික තත්වය ඉහල යාම.

**තාක්ෂණික**

1. ව්‍යාපාර ලියාපදිංචියට නවීන තාක්ෂණය උපයෝගී කරගත හැකිවීම.
2. තාක්ෂණික උපකරණ හඳුන්වාදීම හා 50% මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම.
3. සයිබර් අවකාශය තුලින් ගබඩා පහසුකම් සපයා ගැනීම.

**පාරිසරික**

1. අවම කඩදාසි භාවිතයට නැඹුරුවීම.(Paper less)
2. දිගුකාලීන භාවිතා කල හැකි උපකරණ ප්ලාස්ටික් බඳුන් වෙනුවට හඳුන්වාදීම.
3. ආහාර සෞඛ්‍යය යටතේ කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේද ඇති කිරීම.

**නීතිමය**

1. මෙම ප්‍රඥප්තිය සකස්කර අනුමැතියට ඉදිරිපත් කිරීම.
2. ව්‍යවස්ථා ගැටළු.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 47ක් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබාදීමට සිදුවීම.

## කෘෂිපාදක කර්මාන්ත සංවර්ධන අංශය

**දේශපාලනික**

1. රාජ්‍ය ප්‍රතිපත්තිය ව්‍යවසාය සංවර්ධනය උදෙසා නැඹුරුව
2. ව්‍යවසායකයින් තුල ඇති යැපීම් මානසිකත්වය.
3. නව නිශ්පාදන පිලිබඳ නැඹුරුකරන්නන්ගේ දැනුම මදි වීම.
4. නව ව්‍යවසායකයින් ලාභ ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම මත කෘෂි ව්‍යවසායකත්ව ආකර්ශනය අවම වේ.
5. වසරේ කොටසක් ගත වූ පසු ප්‍රතිපාදන ලැබීම. (ප්‍රමාදවීම)

**ආර්ථික**

1. නව නිශ්පාදනයන්හි ප්‍රමිතිය පිලිබඳ ගැටළුව.
2. නව නිශ්පාදකයන්ට විශාල සමාගම් සමඟ තරඟ කිරීමට සිදුවීම.
3. අමුද්‍රව්‍ය ඒකාකාරීව ලබාගැනීමේ අපහසුව.

**සාමාජයීය**

1. යැපුම් මානසිකත්වය.
2. නව පරපුර කෘෂි කර්මාන්තය සඳහා යොමුකර ගැනීමට නොහැකිය.
3. කෘෂිකර්මාන්තය පිලිබඳ ඇති අයහපත් ආකල්ප.
4. ඉක්මනින් වැඩි ආදායම් ඇතිකර ගැනීම සඳහා නැඹුරුව.
5. වසවිසෙන් තොර ආහාර සඳහා පාරිභෝගික නැඹුරුව.

**තාක්ෂණික**

1. නව/ උචිත තාක්ෂණය දැනුම මදිකම.
2. තොරතුරු තාක්ෂණය යොදාගන්නා ව්‍යවසායකයින් අවමවීම.
